


ලංකානිවුස්
Lanka News UK
Bringing Sri Lankan news to your doorstep

lankanewsuk@yahoo.com WEB: www.lankanewsuk.com Vol: 04 - SEPTEMBER WEB ISSUE 2024

● මහා බ්‍රිතාන්‍යයේ ශ්‍රී ලාංකික ජාතික පුවත්පත ● பெரிய பிரித்தானியாவின் இலங்கைத் தேசியப் பத்திரிகை. ● Sri Lankan National Newspaper in GB

LNUK SEPTEMBER SPECIAL WEB ISSUE



# 2024 ජනාධිපති මැතිවරණය



ජනාධිපති මැතිවරණයට ඇත්තේ දින කිහිපයකි. ඒ සඳහා නාම යෝජනා 38ක් මැතිවරණ කොමිසම වෙත ලැබී තිබුණු අතර එක අපේක්ෂකයකු ඇප මුදල් පවා තැන්පත් නොකර සිටීම නිසා ඔහුගේ අපේෂකත්වය අවලංගු විය. තවත් අපේක්ෂකයෙකු මියගොස් තිබුණි. ජනපතිවෙන්න මැතිවරණයට 36 දෙනෙකු දැනට ඉදිරි පත්ව සිටිති. මෙතක් ශ්‍රී ලංකාවේ පැවති මැතිවරණ වලදී ඉදිරිපත්ව තිබුනේ අපේක්ෂකයන් දෙදෙනකු හෝ තවත් කිහිප දනෙකු පමණි. මෙවර මැතිවරණ කොමිසමට මෙම පිරිසට පහසුකම් සැළසීමට හා චන්ද පත්‍රිකා මුද්‍රණය පිණිස බලාපොරොත්තු නොවූ මුදල් ප්‍රමාණයක් වැය කිරීමට සිදුව ඇත.

සැප්තැම්බර් 21දා පැවැත්වෙන මෙම මැතිවරණ සටනට දැනට අවතීර්ණ වී ඇත්තේ ඇත්තෙන්ම කිහිප දෙනෙකු පමණි. ඔවුන් අතර වත්මන් වැඩබලන ජනාධිපති රනිල් වික්‍රමසිංහ, විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස, පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් වන අනුර කුමාර දිසානායක, නාමල් රාජපක්ෂ, විජේදාස රාජපක්ෂ, සරත් පොන්සේකා හා ප්‍රධාන පෙළේ ව්‍යසාසක වරයෙකුවූ දිලිත් ජයවීරයන්ය. මොවුන් සිය චන්ද සටන මේවන විට දියත් කර දිවයින පුරා රැස්වීම පවත්වමින් සිටිති. ඔවුන් ඉදිරි පස් වසර තුළ ජනාධිපති ලෙස පත්වූ පසු තමන් කරන වැඩපිළිවෙළ සිය ප්‍රතිපත්ති හා පොරොන්දු පිලිබඳ ජනතාව දැනුවත් කරමින් රැස්වීම්, ජනහමු පවත්වමින් දිවයින පුරා සැරිසරනු දැකිය හැකිය. එක්සත් ජාතික පක්ෂයේ රනිල් වික්‍රමසිංහ ඉදිරිපත්වී ඇත්තේ ස්වාධීන අපේෂකයෙකු ලෙසය. සජිත් ප්‍රේමදාස සමගි ජන බල වේගයෙන්ද, අනුර කුමාර ජාතික ජනබල වේගයෙන්ද, නාමල් රාජපක්ෂ පොදු පෙරමුණෙන්ද, දිලිත් ජයවීර මව්බිම ජනතා පක්ෂයෙන්ද ඉදිරිපත් වී සිටිති. සෙසු අය ස්වාධීන අපේෂකයන් ලෙස ඉදිරිපත්ව සිටි. මෙවර රැස්වීම වලට ඇදී එන ජනකාය අති විශාල සංඛ්‍යාවක් බව පැහැදිලිව පෙනීයන කරුනක් වේ. 2024 ශ්‍රී ලංකා ජනාධිපතිවරනය 2024 සැප්තැම්බර් 21 දින පැවැත්වීමට නියමිත අතර, එහිදී ඡන්දදායකයින් වසර පහක ධූර කාලයක් සඳහා ජනාධිපතිවරයෙකු තෝරා ගනු ඇත. වත්මන් ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා ස්වාධීන අපේක්ෂකයෙකු ලෙස නැවත තේරී පත්වීමට අපේක්ෂාවෙන් සිටින අතර, 2015 වසරේ මහින්ද රාජපක්ෂ මහතාගෙන් පසු නැවත මැතිවරණයකට ඉදිරිපත් වූ ප්‍රථම ජනාධිපතිවරයා ඔහු බවට පත්වෙයි.

මෙවර ජනාධිපති මැතිවරණය සඳහා චන්ද දීමට 17.1million including new voters 1 million (17,263,885) ජනකායක් සුදුසුකම් ලබා ඇත. තැපැල් චන්දය සඳහා 7 ලක්ෂයකට අධික පිරිසක් සුදුසුකම් ලබු අතර ඔවුන් සිය චන්දය පසුගිය දින කිහිපය තුළදී දීමට මැතිවරණ කොමිසම විසින් ඉඩකඩ සලසා තිබුණි.

ශ්‍රීලංකාවේ පැවති අවසන් සෘජු ජනාධිපතිවරණය වූයේ 2019 දී වන අතර එහිදී ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ අපේක්ෂක ගෝඨාභය රාජපක්ෂ ඔහුගේ ප්‍රධාන ප්‍රතිවාදියා වූ සජිත් ප්‍රේමදාස පරාජය කරමින් විශිෂ්ට ජයග්‍රහණයක් ලබා ගත්තේය.

2022 ශ්‍රී ලංකා විරෝධතා මධ්‍යයේ ගෝඨාභය රාජපක්ෂ අවසානයේ අනපේක්ෂිතව 2022 ජූලි 14 දින ඉල්ලා අස්වන්නට සිදු විය. මෙය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 40 වැනි ව්‍යවස්ථාව අනුව අනුප්‍රාප්තිකයෙකු තෝරා පත් කර ගැනීම සඳහා සතියකට පසුව පාර්ලිමේන්තුව හරහා වක්‍ර ජනාධිපතිවරණයක් ආරම්භ කළේය. මීට මාස දෙකකට පෙර රාජපක්ෂ විසින් අග්‍රාමාත්‍යවරයා ලෙස පත් කරන ලද රනිල් වික්‍රමසිංහ, වැඩිම ඡන්ද ලබාගෙන ශ්‍රී ලංකාවේ 9 වැනි ජනාධිපතිවරයා ලෙස 2022 ජූලි 21 දින දිවුරුම් දුන්නේය.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 40 වැනි ව්‍යවස්ථාවේ සඳහන් වන්නේ "ජනාධිපති ධූරයට පත්වන ඕනෑම අයෙක් එම ධූර දැරිය යුත්තේ ධූරයෙන් ඉවත්වන ජනාධිපති ධූර කාලය අවසන් නොවන කාලසීමාව සඳහා පමණක් බවයි. ජනාධිපති වික්‍රමසිංහ මහතාගේ ධූර කාලය අවසන් වීමට නියමිත 2024 නොවැම්බර් 17 ය.

2024 මැතිවරණය සම්බන්ධ සාකච්ඡාව වසර ආරම්භයේ සිටම ප්‍රධාන මාතෘකාවක් විය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව සැප්තැම්බර් 17 සහ ඔක්තෝබර් 16 අතර මැතිවරණය පැවැත්විය යුතු බව මැතිවරණ කොමිසම ප්‍රකාශ කර ඇත. ජූලි 26 දින, මැතිවරණ කොමිෂන් සභාව

2 වන පිටුවට...

# ලෝක බලවතුන් තුන්වන ලෝක යුද්ධයකට සැරසෙයි ?

## එය කුමන මොහොතක හෝ ඇරඹීමේ අවධානමක්?

BBC NEWS 12.09.24

දිගු දුර මිසයිල යුක්රේනයට සැපයීම සම්බන්ධයෙන් නේටෝ රටවල් සමග රුසියාව සමඟ යුද්ධයක අවදානමක් පවතින බව රුසියානු ජනාධිපති ව්ලැඩිමීර් පුටින් නේටෝවට අනතුරු අඟවා තිබේ. පුටින් රුසියානු රාජ්‍ය රූපවාහිනියට පැවසුවේ "මෙයින් අදහස් කරන්නේ නේටෝ රටවල්-එක්සත් ජනපදය සහ යුරෝපීය රටවල්-යුක්රේනයේ යුද්ධයට සෘජුවම සහභාගී වීම හැර අන් කිසිවක් නොවන බවයි.

යුක්රේනයට යුද ආයුධ, ප්‍රහාරක ජෙට් යානා හා දිගු දුර මිසයිල සැපයීම හා මොස්කව් හි බ්‍රිතාන්‍ය රාජ්‍ය තාන්ත්‍රිකයින් 6 දෙනෙකු එරට රැඳී සිටිමින් ඔත්තු සේවාවක් පවත්වාගෙන ගියේ යයි චෝදනා කරමින් තානාපති නෙරපා



බ්‍රිතාන්‍යයේ අගමැති Keir Starmer (වම) සහ විදේශ ලේකම් David Lami, සැප්තැම්බර් 12, බ්‍රහස්පතින්දා, එක්සත් ජනපද ජනාධිපති ජෝ බයිඩෙන් සමග සාකච්ඡා කිරීමට පැමිණ, ඔවුන්ගේ ගුවන් යානයෙන් බැස යන ආකාරය. , (AP Photo)

හැරීමට රුසියාව විසින් සැප්තැම්බර් 12 වනදා කටයුතු කර තිබුණි. මෙය "යුක්රේනයට ආයුධ සැපයීම සඳහා එක්සත් රාජධානියට" දිය හැකි දඬුවමක් ලෙස රුසියාවේ පුවත්පත් වල සඳහන් කර තිබේ.

ඉහතකී පියවර සම්බන්ධව වැඩිදුරටත් සාකච්ඡා කිරීමට එක්සත් රාජධානියේ අගමැති ශ්‍රීමත් කීර් ස්ටාර්ම හා බ්‍රිතාන්‍ය විදේශ ඇමත ඩේවිඩ් ලැමි, සැප්තැම්බර් මස 12 දා රාත්‍රියේ විශේෂ ගුවන් යානාවකින් ඇමරිකා එක්සත් ජනපදය බලා පිටත්ව ගියේය. එහිදී ස්ටාමර් එක්සත් ජනපද ජනාධිපති ජෝ බයිඩන් සමඟ සාකච්ඡා පැවැත්වීමට නියමිතය. මේ රුසියාවේ අනතුරු ඇඟවීම බ්‍රිතාන්‍ය අගමැතිවරයා විසින් පසෙකට දැමූ අතර, යුක්රේනයට තමන්ව ආරක්ෂා කර ගැනීමට ඔවුනට අයිතියක් ඇති බව පවසමින්, වැඩිදුරටත් පවසා සිටියේ ඔහු මොස්කව් සමඟ ගැටුමක් අපේක්ෂා නොකරන බව පැවසු බවය.

තවදුරටත් බටහිර නිශ්පාදිත දිගු දුර මිසයිල මගින් රුසියාවට ප්‍රහාර එල්ල කිරීමට යුරෝපය සහ ඇමරිකාව යුක්රේනය වෙත අවසර දුන්නොත් නේටෝව රුසියාව සමඟ යුද්ධයකට අවතීර්ණ වීමේ අවදානමක් පවතින බව රුසියානු ජනාධිපති පුටින් අනතුරු අඟවා ඇත.

බටහිර රටවල් ආයුධ, පුහුණුව යනාදිය ලබා දෙමින් දැනටමත් යුද්ධයට දැඩි ලෙස සම්බන්ධ වී ඇති බව පවසමින් සිටින අතර සමහර රුසියානු මූලාශ්‍ර පවා කියා සිටියේ බටහිර සපත්තු දැනටමත් යුක්රේනයේ භූමියේ තිබූ බවයි.

2 වන පිටුවට...

Lanka News UK
Bringing Sri Lankan news to your doorstep
SEPTEMBER
WEB ISSUE 2024
lankanewsuk@yahoo.com

1 වන පිටුවෙන් ...

## ලෝක බලවතුන් තුන්වන ලෝක යුද්ධයකට සැරසෙයි ?





රුසියානු FSB ආරක්ෂක සේවය පවසන්නේ ඔත්තු බැලීම සහ "රුසියාවේආරක්ෂාවට තර්ජනයක්" බවට සැක කරන බවයි. එම පියවර "බහුවිධ මිත්‍රශීලී නොවන ක්‍රියාවන්ට" එරෙහි පියවරක් බව එහි සඳහන් වේ.

මේ අතර, රුසියාවට බටහිර මිසයිල එල්ල කිරීම යුද්ධයේ බරපතල තීව්‍ර වීමක් ලෙස මොස්කව් සලකන බව රුසියානු ජනාධිපති ව්ලැඩිමීර් පුටින් යෝජනා කළේය.

"තම ස්වෛරීත්වයට සහ භෞමික අඛණ්ඩතාවයට තර්ජනයක් එල්ල වුවහොත්" න්‍යෂ්ටික අවි ඇතුළුව- තමන්ව ආරක්ෂා කර ගැනීම සඳහා පවතින සියලු ක්‍රම භාවිතා කිරීමට සූදානම් බව මොස්කව් පුන පුනා පවසා ඇතැයි" බි,.බි,සී පුවත් අනාවරනය කරයි.

මොස්කව්හි බ්‍රිතාන්‍ය තානාපති කාර්යාලය රාජ්‍ය තාන්ත්‍රික සම්මුතියෙන් ඔබ්බට ගොස් ඇති බව රුසියානු විදේශ අමාත්‍යාංශය පවසයි.

ප්‍රකාශිකා මාරියා සකාරෝවා පැවසුවේ, FSB ආරක්ෂක සේවයේ "මෙම ඊනියා බ්‍රිතාන්‍ය රාජ්‍ය තාන්ත්‍රිකයින්ගේ ක්‍රියාකාරකම් ඇගයීම" සමඟ රුසියානු විදේශ අමාත්‍යාංශය එකඟ වූ බවයි.

"බ්‍රිතාන්‍ය තානාපති කාර්යාලය වියානා සම්මුතිය මගින් නියම කර ඇති සීමාවන් බොහෝ දුරට උල්ලංඝනය කර ඇත," ඇය පවසන්නේ "අපේ ජනතාවට හානියක් කිරීම අරමුණු කරගත් ක්‍රියාමාර් ග" තානාපති කාර්යාලයට චෝදනා කිරීමට පෙරය.

පුටින් රුසියානු රාජ්‍ය රූපවාහිනියට පැවසුවේ "මෙයින් අදහස් කරන්නේ නේටෝ රටවල් - එක්සත් ජනපදය සහ යුරෝපීය රටවල් - යුක්රේනයේ යුද්ධයට ඍජුවම සහභාගී වීම හැර අන් කිසිවක් නොවන බවයි.

# වරද්දගන්නේ නැතුව ජන්දෙ දාන්නේ මෙහෙමයි





**September 12 -2024**

එළඹෙන 21 වනදා පැවැත්වෙන ජනාධිපතිවරණයේදී නිවැරදිව ඡන්දය සලකුණු කළ හැක්කේ කෙසේද?

**මැතිවරණ කොමසාරිස් ජනරාල් සමන් ශ්‍රී රත්නායක මහතා** ඒ පිළිබඳව පැහැදිලි කිරීමක් සිදු කළේය.

## ජනාධිපතිවරණයේදී නිවැරදිව ඡන්දය සලකුණු කිරීම...




'1' මගින් ඡන්දයත්, '2' සහ '3' මගින් මනාප සලකුණු කළ හැකිය.

ඡන්දය පමණක් භාවිත කිරීමට '1' හෝ 'X'සලකුණු කළ හැකිය.

ඒ අනුව, '1' සහ 'X'යන දෙකම ඡන්දය භාවිත කිරීමට සලකුණු නොකරන්න.

### ලංකා නිවුස් යූ කේ ඉල්ලීම එල දරයි!

චන්දය ලකුණු කරන ක්‍රමය පිලිබඳ චන්ද දායකයන්ට පැහැදිලි ලෙස කියාදෙන්න සළස්වන මැයින් චන්ද කොමසාරිස්තුමා වෙත පසු ගිය සැප්තැම්බර් 9 වනදා ලංකා නිවුස් යූකේ ප්‍රධාන කතෘ නීතිඥ ශාන්ත සේනාධීර මහතා විසින් යවනු ලැබූ ඊ මේල් පණිවුඩයේ ප්‍රතිඵලයක් ලෙස රජයේ නිළ මාධ්‍ය ජාලය වන news.lk වහා නිවේදනයක් නිකුත් කර ඒ පිළිබඳව කරන ලද දැනුම් දීම මාධ්‍ය වෙත මුදා හැරි අයුරු ඉතා ප්‍රසංශනීයයි.



'X' සමග වෙනත් ස ල ක ු ණ ක ් , ල ක ු ණ ක ් , ඉලක්කමක් භාවිත නොකරන්න.

1 2 3 4 5 6 ලෙස ඉලක්කම් රැසක් ස ල ක ු ණ ු නොකරන්න.

මේ අතර අද 'බිග් ෆෝකස්' වැඩසටහනේදී අදහස් දැක්වූ මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා එක් අපේක්ෂකයෙකු 50% ඉක්මවූ ඡන්ද ප්‍රතිශතයක් ලබා නොගතහොත් සිදුවන ක්‍රියාදාමය පිළිබඳව ද අදහස් පළ කළේය.

රත්නායක මහතා පැවසුවේ, "සමස්ත ප්‍රතිඵලය අපි දැනගත් පසු කොමිෂන් සභාව තීරණය කරයි ඊළඟට උපදෙස් දෙන්න මනාප ගණන් කිරීමට."

1 වන පිටුවෙන් ...



## 2024 ජනාධිපති මැතිවරණය

විසින් ගැසට් නිවේදනයක් නිකුත් කරන ලද අතර, මැතිවරණය 2024 සැප්තැම්බර් 21 වන දින පවත්වනු ලබන අතර, අපේක්ෂකයින් සඳහා නාමයෝජනා අගෝස්තු 15 වන දිනට ඉදිරිපත් කළ යුතුය. මැතිවරණ කොමිසම සෙනසුරාදා දිනයක පැවැත්වීමට තීරණය කර ඇති අතර, මෙය ඉහළ ඡන්දදායක ප්‍රතිශතයක් සහතික කිරීමට උපකාරී වන බව ප්‍රකාශ කළේය. එදිනම රනිල් වික්‍රමසිංහ මහතා ස්වාධීන අපේක්ෂකයෙකු ලෙස තරඟ කරමින් දෙවන වාරයේ ජනාධිපති අපේක්ෂකත්වය ප්‍රකාශයට පත් කළේය. දළ වශයෙන් මිලියන 17 ක ජනතාවක් මෙම මැතිවරණයේදී ඡන්දය ප්‍රකාශ කිරීමට සුදුසුකම් ලබා ඇත.

ජනාධිපති මැතිවරණය පාදක කරගෙන රජය කර ඇති පොරොන්දු හා වැඩකටයුතු වලින් බිඳක්

1. 2025 ජනවාරි 02 වෙනිදා සිට රාජ්‍ය සේවයේ අවම වැටුප 24% සිට උපරිමය 35% කින් වැඩි වෙනවා. අවම වැටුප රුපියල් 55,000 යි. ජීවන වියදම් දීමනාව රුපියල් 25,000යි. විශ්‍රාමිකයින්ට එයින් 50%ක් ලැබෙනවා. NVQ ශ්‍රේණි අනුව වෘත්තිය සුදුසුකම් ඇතුලුව සඳහටම වැටුප් විෂමතාව අවසන් වන අයුරින් ඒ වැඩපිළිවෙළ සකස් කර තිබෙනවා.

2. ගොවි ණය සියල්ලම කපා හරිනවා.

3. පොහොර රුපියල් 5000/4000 දෙනවා.

4. තරුණ තරුණියන් ලක්ෂයකට රැකියා දෙනවා

5. හැම දිළිඳු පවුලකට රු.10,000-20,000 සහන දීමනාවක්

6. රට පුරා උදාගම් ඇති කරනවා./පාසල් වල මාපිය රැකවරණ ක්‍රමය ආරම්භාකරනවා

7. නිවස නැති පවුල් වලට නිවාස ලබාදෙනවා.

8. අන්තර් ජාල ඩිජිටල් අධ්‍යාපනය තරුණ තරුණියනට ලබාදෙනවා.

9. කැබිනට් මණ්ඩලය 25 ට සීමා කරනවා. සියලුම හිටපු ජනපති වරුන්ගේ හා ඔවුන්ගේ බිරියන්ගේ , මන්ත්‍රී වරුන්ගේ විශ්‍රාම දීමනා, නිවස, වාහන ලබාදීම නතර කරනවා. ආරක්ෂකයන් ලබාදීම නතර කරනවා.

10. උතුරු - නැගෙනහිර පෙදෙස් වල සියලුම 13 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කරණවා. පොලිස් ඉඩම් බලතල ඔවුනට ලබා දෙනවා.

පසුගියදා ජනාධිපති අපේක්ෂකයන්ට විවුර්ත විවාදයක් සඳහා පැමිණෙන ලෙස සියලුම ප්‍රධාන පෙළේ අපේක්ෂකයනට පැරෆල් සංවිධානය මගින් ආරාධනා කර තිබුණි. මේ ආරාධනාව අනුව ඔවුන් බණ්ඩාරනායක සැමරුම් ශාලාව වෙන් කර තිබු අතර මේ විවාදය සිදු කෙරනු ලැබුවේ ජනාධිපති නිතීඥ සාලිය පිරිස් මහතා ය. මේ ආරාධනය පිළගෙන එහි පමණ සිටියේ මව්බිම සුරැකීමේ පක්ෂයේ නායක දිලිත් ජයවීර මහතා පමණක් විය. රනිල් වික්‍රමසිංහ තමාට එදින පැමිණීමට නොහැකි බව කල් තබාම ලිපියකින් දැනුම් දී තිබුණි.

මේ වනවිට මැතිවරණ නීති උල්ලංඝනය කිරීමේ පැමිණිළි සිය කාර්යාලයට ලැබී තිබෙන බව මැතිවරණ කොමිසම මගින් දන්වා තිබුණි. මින් පැමිණිළි විශාල ගණනක් විභාග කර සමථයකට පත්කොට ඇති බව ඔවුන් විසින් සඳහන් කර තිබුණි. රජය හා කැබිනට් මණ්ඩලයද නීති උල්ලංඝනය කරනු ලැබුවන් අතර සිටින බව සඳහන්වේ. රාජ්‍ය බලය උයෝගී කර ගෙන මේ දක්වා මෙතෙක් පවතී කිසිදු මැතිවරණයක නොතිබුණු අයුරින් බලය උපරිමයෙන් ගෙන සිය මැතිවරණ ව්‍යාපාරය ගෙනයනු දක්නට ලැබෙන බව යු ටියුබ් හා සමාජ මාධ්‍ය මෙන්ම රූපවාහිනී නාලිකාවල විවාදවලදී ද පුවත්පත් විශ්ලේෂනයන්හි සඳහන් වී තිබේ. තවද මෙතෙක් නොදුටු අයුරින් එකිනෙක අපේක්ෂකයන්ට අවලාද දොස් නැගීම මඩ ගැසීම දිගින් දිගටම ඔවුන්ගේ රැස්වීම් වලදී සිදු කරනු දක්නට ලැබේ. මෙය සදාචාරාත්මක මැතිවරණයකින් ඔබ්බට යන හැසිරීම් රටාවක් නිර්මානය වී ඇති බව කණගාටුවෙන් හෝ කිව යුතු කරුනක්වේ. බොහෝ මාධ්‍ය ඒ පිළිබඳ සඳහන් කරන්නට විශේෂයෙන් සිංහල පුවත්පත් මුනිවත රකිමින් සිටිති. දෙමල හා ඉංග්‍රීසි ඇතැම් කොලොම් නැතිනම් තීරු රචකයන් පරිනත දේශපාලනඥයෙකුවූ ජනපති අපේක්ෂක රනිල් වික්‍රමසිංහ ගේ හැසිරීම් රටාව දැඩි ලෙස විවේචනයට ලක් කොට තිබේ. මෙය ඉතා ශෝචනීය කරුණක් බව කිවයුතුය.

ජනාධිපති මැතිවරණයේ මහත්මා දේශපාලනය අමතකවී කෙසේ හෝ දිනන්නට නැතිනම් ජනපති වෙන්නට තමන්ට පුලුවන් හැම පියවරක්ම ගැනීමට ඇතැම් අපේක්ෂ්කයන් හා ඔවුන්ගේ ආධාරකරුවන් පෙලඹ ඇති සෙයක් ඒ පිලිබඳ පුවත් වලින් අනාවරයවේ, මහනුවර පැවති සජබ රැස්වීමට ගල් ගැස්සිමත්, මාලිමවේ රැස්වීමකදී හු කීමත් මෙවැනි කටයුතුවල ආරම්භයක් විය.සුපිරි හෝටලවල මෙවන් කඩාකප්පල්කාරී ක්‍රියා කරන්නට සැළසුම් දියත්වෙමින් තිබෙන බව යු ටියුබ් නාළිකාවක සඳහන් කර තිබුණි.

චන්දය දෙන දිනයේ දී විපක්ෂයට වාඩි චන්ද වැටෙන පොළවල් ආසන්නයේ කළබල ඇතිකර ලීම සඳහා ආයුද හමුදාවෙන් ලබාගන්නට කරනලද අනාවරනය හා පසුව ඒ තොරතුරු දුන් අයවලුන් හමුදා අත් අඩංගුවට ගෙන තිබු බවද තවත් ජනප්‍රිය නාළිකාවක මගින් ජනගත කර තිබුණි. මෙහි අරමුණ ඉතා පැහැදිලිය. ඒ කෙසේහෝ තමන් ජය ගත යුතුය යන මතයේ ඇතැම් දේශපාලකයන් තවමත් සිටින බවට පැහැදිළි කරුණකි.

තවත් පුවතක කියවුනේ එක්තරා පක්ෂ අපේෂකයෙකුගේ බිරිඳක් සිය ආරක්ෂක රැකවලුන් පිරිවරා හමුදා කඳවුරකට ඇතුළුවී කරණු ලැබූ චන්ද ව්‍යාපාරයක් පිළිබඳව යු ටියුබ් වීඩියෝ දර්ශනයන්ය. මෙය මින් පෙර නොවූ විරු තරම් අප්‍රසන්න චන්ද සටනකි. අපි විදේශ රටවල වෙසෙමින් නිහඩව මැතිවරණ රැසක් පසුගිය දශක කිහිපයක් මුළුල්ලේ අත්විදි පිරිසක්වේ. අපි මේ ක්‍රියා පිළිවත් අපිරියාවෙන් ඉවත දමන අතර අප හැම බලාසිටින්නේ කවදා මේ සංස්කෘතිය අප මව් බිමෙන් අවසන් වේදැයි යන අධිෂ්ඨානයෙණි.

**ශාන්ත සේනාධීර**

**ලංකා නිවුස් යුකේ September 16 2024**

# ඡන්ද මධ්‍යස්ථානවල කලබල ඇති කළොත් වෙඩි තැබීමට පොලීසියට බලය



ARUNA LK NEWS- September 2024

ඡන්ද මධ්‍යස්ථානවලදී කලබල ඇති කර ඡන්දයට බාධා කරන සහ මැතිවරණ කටයුතු කඩාකප්පල් කරන පුද්ගලයන්ට සහ මැර කණ්ඩායම් පාලනයට වෙඩි තැබීමට පොලීසියට බලයදී ඇතැයි මැතිවරණ කොමිෂන් සභා ආරංචි මාර්ග සඳහන් කරයි.

එසේම එවැනි කලබල කරන පිරිස් වහාම අත්අඩංගුවට ගැනීමටද මැතිවරණ කොමිසම පොලිසියට උපදෙස් දී ඇත.

ජනාධිපතිවරණ ඡන්ද විමසීමට පෙර රට පුරා අනවසර ගිනිඅවි සහ පාතාල කල්ලි අත්අඩංගුවට ගැනීමට විශේෂ මෙහෙයුමක් ක්‍රියාත්මක කරන බව ආරක්ෂක අමාත්‍යාංශ ආරංචි සඳහන් කළේය.

විශේෂ බුද්ධි අංශ කණ්ඩායම් ද ඒ සඳහා යොදවා ගැනෙන බව අමාත්‍යාංශ ප්‍රකාශකයෙක් පැවසීය.

රට පුරා අනවසර ගිනි අවි ලක්ෂ දෙකක් පමණ පවතින බවට ආරක්ෂක අංශ අනුමාන කරයි.

ජනාධිපතිවරණ ඡන්ද විමසීම ලබන 21 වැනිදා පැවැත්වේ.ජනාධිපතිවරණයේදී ඡන්දය පාවිච්චි කිරීමට සුදුසුකම් ලබා සිටින ඡන්ද දායකයන් සංඛ්‍යාව එක් කෝටි හැත්තෑ ලක්ෂයකි.

මෙවර ජනාධිපතිවරණයේදී ඡන්දය පාවිච්චි කිරීමට ඡන්ද දායකයන් ලක්ෂ දහයක පමණ පිරිසක් අලු􏰀තින් එකතු වී සිටින බව කොමිෂන් සභා ආරංචි මාර්ග සඳහන් කළේය.

# විදෙස් ඔත්තු සේවා ජනපති සටනට බහී

## රනිල්, සජිත්, අනුර සහ නාමල්ගේ රැලිවලටත් රිංගයි



මෙරට නව ජනාධිපති කවුරුන්ද යන්න සම්බන්ධව කලින් තොරතුරු දැන ගැනීමට ඇමරිකාව, ඉන්දියාව සහ චීනය යන රටවල රහස් ඔත්තු සේවා නිලධාරීන් විශාල පිරිසක් ශ්‍රී ලංකාවට පැමිණ ඇතැයි එම තානාපති කාර්යාල අභ්‍යන්තර තොරතුරු අනුව අනාවරණය වේ.

ඔවුන් ජනාධිපතිවරණයේ ප්‍රධාන අපේක්ෂකයන් වන රනිල් වික්‍රමසිංහ, සජිත් ප්‍රේමදාස, අනුර කුමාර දිසානායක සහ නාමල් රාජපක්ෂ යන මහත්වරුන්ගේ මැතිවරණ රැලිවලට ද ගොස් ලබාගත් තොරතුරු සිය රටවලට දැනුම් දී ඇතැයි ද වාර්තා වේ.

ඉන්දීය රජයේ වැඩි අවධානය යොමුවී ඇත්තේ උතුරේ ජනතාව සහ වතුකරයේ ද්‍රවිඩ ජනතාවගේ ඡන්දය පිළිබඳවය.

ඇමරිකාව නාගරික ජනතාවගේ මතය පිළිබඳව අවධානය යොමුකර තිබේ.

චීනයේ වැඩි අවධානය යොමුකර ඇත්තේ ඇමරිකාව සහ ඉන්දියාව වැඩි අවධානයක් යොමු කරන අපේක්ෂකයා කවුරුන් දැයි කියා සොයා බැලීමටය.

පසුගිය 2019 ජනාධිපතිවරණයට වඩා මෙවර ඔවුන් වැඩි අවධානයක් යොමුකර ඇත්තේ ජනාධිපතිවරණ සටන ප්‍රධාන අපේක්ෂකයන් තිදෙනෙකු අතර පවතින නිසා යැයි ද වාර්තා වේ.

**උපාලි ද සේරම් Divaina.lk**

# ජනාධිපතිවරණ පැමිණිලි සංඛ්‍යාව තවත් ඉහළට

**ARUNA LK NEWS**
**14 September 2024**

2024 ජනාධිපතිවරණයට අදාළ ව මේ වනවිට පැමිණිලි 3,828ක් ලැබී ඇති බව මැතිවරණ කොමිසම පැවසීය.

ඉන් පැමිණිලි 28ක් ප්‍රචන්ඩ ක්‍රියා සම්බන්ධයෙන් බවත්, තවත් පැමිණිලි 3,720ක් මැතිවරණ නීති උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් බවත් හෙතෙම වැඩිදුරටත් සඳහන් කළේය.

මේ අතර මෙවර ජනාධිපතිවරණයට අදාළව ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාවේ සුළු වැඩිවීමක් දැකිය හැකි බව මැතිවරණ කොමසාරිස් ජනරාල් ආර්.එම්. ඒ. එල් රත්නායක මහතා පවසා සිටියේය.

එමෙන්ම ජනාධිපතිවරණයට අදාළව පොලිසිය වෙත පැමිණිලි 350ක් ලැබී ඇති බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නීතිඥ නිහාල් තල්දුව මහතා ද ප්‍රකාශ කළේය.

# පෙර වසරට සාපේක්ෂව සංචාරක කර්මාන්තයේ 66%ක වර්ධනයක්



**ARUNA LK NEWS**
September 2024 -

**2024 වසරේ මුල් මාස 8ක කාලය තුළ සංචාරක කර්මාන්තයෙන් ඩොලර් බිලියන 2.16ක් උපයා තිබෙන බව මහ බැංකුව පවසයි.**

එය පෙර වසරට සාපේක්ෂව 66%ක වර්ධනයක් බව වාර්තා වේ.

මහ බැංකුව වැඩිදුරටත් සඳහන් කළේ පසුගිය වසර තුළ සංචාරක කර්මාන්තයෙන් ඉපැයූ සමස්ත ආදායම් ඉලක්කය මෙම වසරේ මුල් මාස 8 තුළ සපුරාගෙන තිබෙන බවයි.

# පළමු මාස 07ට ලාංකිකයන් 175,163ක් රැකියා සඳහා විදේශගත වෙයි



ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සඳහන් කළේ මෙම කාලය තුළ ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ ඇමරිකානු ඩොලර් මිලියන 3,710.8ක් වාර්තා වී ඇති බවයි

මෙය 2023 වසරේ මුල් මාස 07ට සාපේක්ෂව වැඩිවීමක් පෙන්නුම් කර ඇත.

2024 ජූලි මාසයේදී ශ්‍රී ලාංකිකයන් 28,003 දෙනෙක් රැකියා සඳහා විදේශගත වී තිබේ.

ශ්‍රී ලංකා මහ බැංකුවේ නව වාර්තාවකට අනුව 2024 පළමු මාස 07 තුළ ශ්‍රී ලාංකිකයන් 175,163ක් විදේශ රැකියා සඳහා පිටත්ව ගොස් තිබෙන බවයි වාර්තා වේ.

එම කාලය තුළ රැකියා සඳහා 171,864ක් විදේශගත වී ඇති අතර ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ ඇමරිකානු ඩොලර් මිලියන 3,363.6ක්.

වාර්තාවට අනුව රැකියා සඳහා වැඩිම විදේශගතවීම් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ 2014 වසරේදීය.

# නව සංගීත ආරක් ලාංකික සංගීත රසිකයන්ට හඳුන්වාදුන් සේනක බටගොඩ ගී හඬ නිසල විය



සේනක බටගොඩ අපේ තරුණ පරපුර අමනාන්දනයට පත්කළ විවිධ කුසලතා වලින් හෙබි සංගීතඥයෙක්, ගායකයෙක් සහ තනු නිර්මාපකයෙකු විය.ඔහු සිය ගමන් මග අද අවසන් කර තිබුණි. මේ බව සඳහන් රසික හද සසල කරවුණු පුවතින් කියවුනේ රාගම රෝහලකදී ඔහු මිය ගොස් තිබු බවයි. 1958 ජූනි මස 25 දා උපතලැබූ සේනක මිය යනවිට 66 වියෙහි පසු විය. ඔහු කුඩා කල සිටම ගායනය සහ බෙර වාදනය සඳහා ඔහුගේ ආශාව සොයා ගත්තේය. ඔහුගේ නව යොවුන් වියේදී, ඔහු ගායන ශිල්පියෙකු සහ ගිටාර් වාදකයෙකු ලෙස ඔහුගේ බහුකාර්යතාව පෙන්නුම් කරමින් රොක්, රෙගේ සහ පොප් වැනි ප්‍රභේද ගවේෂණය කළේය. සේනකගේ අභිලාෂය ඔහු ගීත රචනයට සහ සංගීත නිෂ්පාදනයට යොමු කළේය.

විවිධ සංගීත ශෛලීන් සඳහා ඔහුගේ කැපවීම පිළිබිඹු කරමින් ඔහු සිය පළමු කෘතිය 1994 දී නිකුත් කළේය. ඔහු ගැයූ ගී අතර අපි කවුරුද, සැනසෙන්නම් මා, හීනවලට පණක්, අනන්තයට යනවාමයි, අළුයට ගිනි, බිඳගෙන යමු, අපි සැනසිල්ලේ ඔහුගේ ජනප්‍රිය ගීත සමහරෙකි .

ඔහුගේ සංගීත ගමන කලාත්මක ප්‍රකාශනය සඳහා ඔහු දක්වන කැපවීම පිළිබඳ සාක්ෂියකි. සේනක බටගොඩගේ අපූර්ව ජන ආභාසය, බහුශ්‍රැත ගායනය, විවිධ ශානරයන්හි ප්‍රවීනත්වය ප්‍රේක්ෂකයන්ගේ සිත් ඇද බැඳ තබා ඇත. ඔහු සංගීත ලෝකයට සදාකාලික බලපෑමක් ඇති කරමින් ඔහුගේ සංගීතය නිර්මාණය කිරීමින් නව ආරක සංගීත සම්ප්‍රදායක් ඔහු අප රටට හඳුන්වා දුන්නේය.

**සේනක ඔබට සුභ ගමන් !**

**Shanthi Senadheera -Lanka news UK**

# නෙත්මිට ස්පාඤ්ඤයේදී ලෝකඩ පදක්කමක්



Ada derana.lk

ස්පාඤ්ඤයේ ඡදබඑැඩාර් නුවර පැවැත්වෙන වයස 20න් පහළ ලෝක ශූරතා මල්ලවපොර ශූරතාවලියේ ඊයේ (06) පැවැති කාන්තා කි.ග්‍රෑ. 53 බර පන්තියේ ලෝකඩ පදකක්ම දිනාගැනීමට නෙත්මි අහිංසා ප්‍රනාන්දු සමත් වූවාය.

මෙය ශ්‍රී ලංකා මල්ලවපොර ඉතිහාසයේ ශ්‍රී ලාංකේය ක්‍රීඩිකාවක් දිනූ උසස්ම පදක්කමක් ලෙස සැලකෙයි.

එමෙන්ම ඇය මෙහිදී විනාඩි 08කට වැඩි කාලයක් තරගයේ නිතර වී ඇති අතර, එය එතෙක් මෙතෙක් මෙරට මල්ලවපොර ක්‍රීඩිකාවක් වැඩි වේලාවක් තරගයේ රැඳී සිටි අවස්ථාව ලෙසින්ද සැලකෙයි.

නෙත්මි සිය ලෝඩක පදකක්ම වෙනුවෙන් වූ තීරණාත්මක තරගයේදී රුසියානු ක්‍රීඩිකාව තරග වට 3-1(6-2) ලෙස පහසුවෙන් පරාජය කළාය.

තරගාවලිය ආරම්භ කරමින් ඇය සහභාගි වූ මූලික තරගයෙන් කසක්ස්තාන ක්‍රීඩිකාව තරග වට 4-0 (10-0) ලෙස පහසුවෙන් පරාජය අතර, මුහුණ දුන් දෙවැනි තරගයෙන් බල්ගේරියානු ක්‍රීඩිකාව ද තරග වට 4-0 (10-0)ක් ලෙස පරාජය කළහ.

එමෙන්ම ඇය අර්ධ අවසන් පූර්ව වටයේදී හංගේරියානු ක්‍රීඩිකාවක් සමග තරග වැදුණු අතර, එම තරගයෙන්ද ඇය තරග වට 4-1ක පහසු ජයක් ලැබීය.

කෙසේ නමුත් අවසන් මහා තරගයට සුදුසුකම් ලැබීම වෙනුවෙන් පැවති අවසන් පූර්ව තරගයේදී ඇය චීන ක්‍රීඩිකාවක් හමුවේ තරග වට 5-0ක් ලෙස පරාජය වූවාය.

2022 පොදුරාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල ඇතුළු ජාත්‍යන්තර තරග ඉසව් රැසකදීම නෙත්මි මීට පෙර ශ්‍රී ලංකාව වෙනුවෙන් පදක්කම් දිනා ඇත.

නෙත්මිගේ ප්‍රධාන පුහුණුකරු ලෙස සුරංග කුමාර මහතා කටයුතු කරයි.

මෙම තරගාවලියට නෙත්මිට අමතරව ශ්‍රී ලංකාව නියෝජනය කරමින් නිපුනි වාසනා සහභාගී වූ අතර, ඇය කි.ග්‍රෑ. 50 බර පන්තියෙන් තරග වැදුණාය. කෙසේ නමුත් ප්‍රතිවාදී ක්‍රීඩිකාවන් සමග කරට කර සටනක් දුන්න ද ඇයට පදක්කමක් දිනාගැනීමට නොහැකි වූවාය.

# ශ්‍රී ලංකාවේ වනජීවී අපරාධයක් සඳහා මෙතෙක් පැනවූ ඉහළම දඩය නියම කෙරේ

**September 13, 2024 - adaderana.lk**

යාල වනෝද්‍යානයෙන් සමනල විශේෂ 92ක් ඇතුළුව ආවේණික කෘමීන් සිය ගණනක් හොර රහසේ රැගෙන යාමට උත්සාහ කළ ඉතාලි ජාතික පියෙකුට සහ ඔහුගේ පුතාට ශ්‍රී ලංකා රුපියල් කෝටි 6ක දඩයක් නියම කර තිබේ.

එම මුදල අමෙරිකානු ඩොලර් 200,000කට සමාන වෙයි.

නීතිවිරෝධී ලෙස කෘමීන් එකතු කිරීම, සන්තකයේ තබා ගැනීම සහ ප්‍රවාහනය කිරීම සම්බන්ධයෙන් සැප්තැම්බර් මස මුලදී ඔවුන් වරදකරුවන් කර ඇති අතර ඔවුන් දෙදෙනාට තිබූ දඩය මෙරට වනජීවී අපරාධයක් සඳහා නියම කර ඇති ඉහළම දඩය නියම ලෙස සඳහන් වෙයි.



තිස්සමහාරාම මහෙස්ත්‍රාත් තරිඳු සමීර ද සිල්වා මහතා විසින් පසුගිය 3 වනදා එම නියම කරන කළේය.

යාල ජාතික වනෝද්‍යානයේ ආරක්ෂකයින් විසින් 68 හැවිරිදි ලුයිගි ෆෙරාරි සහ ඔහුගේ 28 හැවිරිදි පුත්‍රයාව මේ වසරේ මැයි 8 වනදා කෘමීන් අඩංගු භාජන සමග අත්අඩංගුවට ගෙන තිබුණි.

අප වාර්තාකරු සඳහන් කළේ එම සැකකරුවන් දෙදෙනාට චෝදනා 810ක් එල්ලකර තිබුණ ද පසුව එය 304 දක්වා අඩුකළ බවය.

ඉතාලි ජාතිකයින් වෙනුවෙන් වෙනත් ප්‍රදේශවලින් පැමිණි නීතිඥ කණ්ඩායමක් පෙනී සිටි අතර ඔවුන් විත්තිය වෙනුවෙන් අධිකරණයට කරුණු දක්වමින් කියා තිබුණේ සැකකරුවන් දෙස සානුකම්පිතව බලා අවම දඩයක් නියම කරන ලෙසය.

එහිදී විත්තියට කරුණු පැහැදිලි කළ මහෙස්ත්‍රාත්වරයා පවසා ඇත්තේ මෙම සිද්ධියට අදාළ විත්තිකරුවන් විදේශ ජාතිකයින් නිසා මෙම නඩුකරය ඉක්මනින්ම විසඳීම සඳහා අධිකරණය ඉතා ඉක්මනින් කටයුතු කළ බවත් ඊට අදාළ විශේෂඥ වාර්තා කඩිනමින් කැඳවීමට හැකිවූ බවත් ය.

වන සත්ත්ව හා වෘක්ෂලතා ආඥා පනතට අනුව මෙය ආරක්ෂිත සතුන් සම්බන්ධයෙන් කළ වරදක් බැවින් ගොනු කරන ලද චෝදනා 304ටම ඔවුන් දෙදෙනා වැරදිකරුවන් වන බව මහෙස්ත්‍රාත්වරයා කියා සිටියේය.

ඒ අනුව එක් එක් චෝදනාවට අදාළ දඩ මුදල අධිකරණයට කියා සිටි අතර එහි මුළු එකතුව ලෙස රුපියල් හයකෝටි එක් ලක්ෂ අසූ දහසක මුදලක් ගෙවන ලෙස මහෙස්ත්‍රාත්වරයා චූදිතයින්ට නියෝග කර සිටියේය.

මේ මස 29 වන දින දඩ මුදල ගෙවන ලෙසට අධිකරණය නියෝග කළ අතර දඩ මුදල ගෙවන තෙක් මෙම විදෙස් ජාතිකයින් දෙදෙනාට රටින් පිටව යාමට කිසිදු අවසරයක් නොමැති බවද සඳහන් කළේය.

SEPTEMBER
WEB ISSUE 2024
lankanewsuk@yahoo.com
Lanka News UK
Bringing Sri Lankan news to your doorstep



# ශ්‍රීමත් ජෝන් ඩොයිලි

# Sir John D'oyly (1774-1824)

## Article part 2

1815 උඩරට ගිවිසුම අත්සන් කළ දිනය පිලිබඳ මත කිහිපයක් ප්‍රකාශ කොට ඇත. එහි ප්‍රධාන නියමුවා වූ ඩොයිලිට අනුව එය අත්සන් කර ඇත්තේ මාර්තු මස 02 වැනිදාය. මෙම ගිවිසුම අත්සන් කර දස වසරක්වත් ජීවත්වීමට ඩොයිලිට නොහැකි විය. ඒ පිළිබඳ උඩරැටියන් බොහෝ දෙනකුගේ අදහස වූයේ ඔහුට රට පාවාදීම නිසා මෙරට ජනතාවගේ ශාපය වැදුණු බැවින් ඉක්මන් මරණයක් ඔහු ගොදුරුවූ බවය. තවකකුගේ මතය වූයේ විස ශරීරගත වීමකින් ඔහුගේ දිවි තොර වූ බවය.

කෙසේ වුවත් 'ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය' මීට වසර දෙසීයකට පෙර 1824 දී ඩොයිලිගේ මරණය ගැන සඳහන් කළේ මෙලෙසිනි.

"ලංකාවේ මහරජතුමාගේ සභාවේ සාමාජිකයකු වූද, උඩරට පළාත් පිළිබඳ රජුගේ නියෝජිත තැන සහ පළමු වැනි කොමසාරිස් වූද, ගරු සර් ජෝන් ඩොයිලි මහත්මා සත් කෝරලේ නිල ගමනක යෙදී සිටියදී වැලඳුණු උණ සන්නිපාතයෙන් 1824 මස 25 වැනි දින අලුයම 1ට පමණ මහනුවරදී පරලෝ සැපත් විය. මේ මස 26 වැනි දින උදේ 7.00ට ඔහුගේ දේහය නිල නිවෙසේ සිට යුද සොහොන් බිමට ගෙන යන ලදී. එම අවමඟුල් පෙරහර පෙළ සැදී ගමන් කළ අතර ආරක්ෂක භට පිරිස් මාලිගාවේ සිට සොහොන් බිම දක්වා මඟ දිගේ ආයුධ පහත හෙළා පෙළ ගැසී සිටියේය. රාජකීය කාලතුවක්කු සේනාංකය විසින් මෙහිදී කුඩා කාලතුවක්කු වෙඩි මුර ආචාරයක් පවත්වන ලදී."

ජෝන් ඩොයිලි මියගොස් දැනට වසර 200කි. ඔහුගේ දේහය මිහිදන් කෙරුණේ මහනුවර දළදා මාලිගය සමීපයේ පිහිටි බිම්කඩකය. ඒ වෙනුවෙන් ඉදිකළ ඔහුගේ සොහොන් ස්මාරකය අදත් ගැරිසන් සුසානයේ සුවිශේෂව දක්නට ලැබේ. මෙම සුසාන භූමිය සියැසින් දැක ගැනීමට 2023 මටද හැකි විය. මේ අවස්ථාව සළසා දුන්නේ අප පුවත්පත ආරම්භයේ පටන් මහත් උනන්දුවෙන් හා කැපවීමෙන් පුවත්පත නිර්මාණය කර, අපට පසුගිය පස් වසර තුල ම දායකත්වය ලබාදෙන ගම්පොල පදිංචි රොෂාන් ප්‍රියන්ත රත්නායකයන් ය. ගැරිසන් යනු "සෙබළුන්ගේ රැඳවුම් පොළ" යන අර්ථය දෙන එකක් බව සඳහන්වේ. මෙම සුසානභූමිය පිහිටා ඇත්තේ දළදා මාලිගය පිටුපස පිහිටි උඩවත්ත කැලයට යාබදව පර්චස් 120 ක පමණ බිම්කඩකය. 1817 සිට වසර 133 බ්‍රිතාන්‍ය පාලනය කල කාල වකවානුව තුළ මෙහි ජීවත්ව සිට මිය ගිය පිරිසකගේ සොහොන් කොත් සමූහයකි. විවිධ තාරතිරම් වලට අයත් හමුදා සෙබළුන් පරිපාලකයන්, වැවිලි කරුවන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ සොහොන් කොත් ප්‍රමාණයක් එහි මිහිදන් කර ඇත. එකළ දිවයිනේ වාසය කළ ඒ පිරිස් ගේ නෑදෑ හිතමිතුරන් මෙන්ම විදේශිකයන් විශාල පිරිසක් වාර්ෂිකව එය නැරඹීමට පැමිනෙන බව එහි භාර කරුගෙන් අපට දැනගත හැකිවිය.



ලියුම්කරු, 2023 වසරේ මහනුවර, ගැරිසන් සුසානයේ ඇති ඩොයිලි ස්මාරකය අසල. (පිටුපසින්)

ගැරිසන් සුසාන භූමිය පිළිබඳ වෛද්‍ය නිහාල් කරුණාරත්න විසින් ප්‍රකාශයට පත්කර ඇති "උඩවත්ත කැලේ" කෘතියට අනුව 1914 දී මෙහි සොහොන් කොත් 163ක සංඛ්‍යාවක් තිබෙන බව සඳහන් කර තිබේ. එනමුත් තවද මළ සිරුරු 450ක් භූමදානය කර ඇති බව ඔහු සඳහන් කොට ඇත. මිට හේතුවී ඇත්තේ බ්‍රිතාන්‍ය වැසියන් එකළ විශේෂයෙන් පවුල් සඳහා එක සොහොන් කොතක් වෙන්කර තිබුණි. මිට හේතු වූ මුල් කරුණක් වුයේ පල්ලියේ සුසාන භූමියේ තිබු ඉඩකට ඉතා සිමා සහිත වූ එකක් වීම හා එක සොහොන් කොතක් තැනීම පිණිස විශාල මුදලක් වැය කිරීමට සිදුව තිබීම නිසා බව සඳහන් වේ. ඇතැම් සොහොන් කොත් නිමවා ඇත්තේ කිරිගරුඬෙනි. ඒවා ධනවතුන්ගේය. තවත් ඒවා ගඩොලින්ය. ඒවායේ ආකෘතිය බොහෝ සෙයින් බ්‍රිතාන්‍ය සොහොන් කොත්වල හැඩය පිළිබිඹු වේ. මේ සොහොන් කොත් කඩා වැටී හා දිරාපත්වී ඇති සෙයක් අපට එහිදී දැක ගත හැකි විය. මේ සුසාන භූමිය පිලිබඳ ඉංග්‍රීසි බසින්ද පොත් කිහිපයක්ම ද පුවත්පත් ලිපි රැසක්ද ප්‍රකාශයට පත්කර ඇත.

මොහු උඩරට තොරතුරු ආදිය දැන ගැනීම උදෙසා චරපුරුෂ සේවය යෙදවීමට ක්‍රියා කළේය. ගජමන් නෝනා සමග ආදර සබඳතාවක් පැවති බවට ජනප්‍රවාදයක් ඇත. ජෝන් ඩොයිලි විසින් ගජමන් නෝනා සමඟ තරඟයට කවි ලිවීම පවා සිදු කර ඇත. මේ සබඳතාවය කොතෙක් දැයි කිවහොත් ඩොයිලි විසින් ඇයට රුහුණේ ගම්වරයක් තෑගි පිණිස ප්‍රධානය කර තිබුණි. අද පවා මේ ගම "නෝනාගම" ලෙස හඳුන්වනු ලබන අතර එය හම්බන්තොට ආසන්නයේ පිහිටා ඇති ගමක් වේ. ගජමන් නෝනා (දෝන ඉසබෙලා කොරනේලියා) විසින් ඩොයිලිට ලියු කවි පන්ති රැසක් විය. මේ දේපල අතර සිදුවූ සිද්දීන් සිංහල කවියෙන් යැවීමට තරම් ප්‍රබල භාෂා ඥානයක් ඩොයිලි සතුව තිබු බව සඳහන්වේ. ගජමන් නෝනාගේ කවි අළලා ආචාර්ය බන්දුසේන ගුණසේකරයන් විසින් රචිත ගජමන් නෝනාගේ කවි සීපද පොතෙහි මේ කවි පන්ති රැසක් පළකර ඇත.


මෙලෙසින් ගුණ නැණින්
යස සැපතින් දිලෙන

සිය පින් සිරි බෙලෙන්
දිය තුළ පසිදු වන

සුපසන් ජෝන් ඩොයිලි
මේ දිසාපති සොබන

සමිඳුන් හට නැමද
පානෙමි දුක් මෙවන

ජෝන් ඩොයිලි විසින් පහතරට මෙන්ම උඩරට සිටි රදලයින් සහ සාමාන්‍ය ජනතාවට තෑගි ලබාදෙමින් එම සමාජයේ තොරතුරු රැස්කරගන්නා ක්‍රමයක් පවත්වාගෙන ඇත. මොහු උඩරට තොරතුරු ආදිය දැන ගැනීම උදෙසා චරපුරුෂ සේවය යෙදවීමට ක්‍රියා කළේය. එවකට ජෝන් ඩොයිලි රජයේ භාෂා පරිවර්ථකයා මෙන්ම කොළඹ දිසාපති තැනද හෙබ වූ හෙයින් මේ වැඩ කටයුතු සාර්ථකව ඉටුකර ගැනීමට ඔහුට හැකිවිය. මෙය අති සාර්ථකව සූක්ශමව කලේ යැයි ඇතැමෙක් සඳහන් කර ඇතත් සිංහලේ රජු වන ශ්‍රී වික්‍රම රාජසිංහ විසින් කිහිප විටක්ම ඩොයිලිගේ දූතයින් හඳුනාගෙන ඔවුන්ට රජකාලේ දඬවම් ලබා දී ඇත. එසේම මල්වත්ත විහාරයේ සංඝයා වහන්සේලා ඩොයිලි සමග වැඩිපුර ඇයි හොඳයි සම්බන්දකම් පවත්වනවා යැයි රජුට හැඟී ගොස් ඇති බැවින් ඔවුන් සමග තිබූ ගනුදෙනු බොහොමයක්ම රජු විසින් අඩු කොට තිබුනි. අවසානයේ ඩොයිලිගේ ළඟම හිතවතෙක් වූ වත්තල අප්පු නැමැත්තා උඩරට රජු විසින් අල්වා උල තබා මරන තැනට පත්කරන ලද බවත් ඩොයිලිගේ දිනපොත සංස්කරණය කළ එච්, ඩබ්ලිව් කොඩ්රින්ටන් මහතාගේ කෘතියේ සඳහන් කොට ඇත.


DIARY
OF
MR. JOHN D'OYLY.

(Afterwards SIR JOHN D'OYLY, BART., Resident, Principal Accredited Agent, and First Commissioner of the British Government in the Kandyan Provinces)
1810—1815.

With Introduction and Notes by
H. W. CODRINGTON, B.A., Oxon., M.R.A.S., F.R.N.S.
Ceylon Civil Service.

[Special publication issued by the Ceylon Branch of the Royal Asiatic Society, Volume XXI., No. 69, 1917.]

The design of the Society is to institute and promote inquiries into the History, Religions, Languages, Literature, Arts, Sciences and Social Condition of the present and former Inhabitants of the Island of Ceylon.

COLOMBO:
COLOMBO APOTHECARIES CO., LTD.,
PRINTERS.
1917.

CENTRAL ARCHAEOLOGICAL LIBRARY (New Delhi)
Library Reg. No A355 INDIA
891.05 C.R.A.S.

"උඩරට රාජ්‍යයේ වැටීම ගැන මගේ අදහස නම් ශ්‍රී වික්‍රම රාජසිංහ යන රජතුමා සැබැවින්ම සැබෑ දක්ෂයෙක් වී තිබුනි. දැනට නුවර යැයි අපට හඳුනාගන්නට ඇති නුවර දළදා මාලිගයේ කොටස්, නුවර වැව, අවට පාර ආදිය රජතුමාගේ නිර්මාණයන් විය. ඩොයිලිගේ පොතේ සඳහන් වන අන්දමට රජතුමා වැසියන් ගැනද හොඳ අවබෝධයකින් කටයුතු කොට ඇත. උඩරට රාජ්‍යය වැටීම කෙරෙහි උඩරට රාජ සභාවේ එවක සිටි මහාධිකාරම් වරු සහ නිළමේ වරුන් සතුව තිබූ රාජපක්ෂ භාවයේ අඩුපාඩුව හේතු වී තිබුණි. රාජාන්ඩුවක පැවැත්ම රඳා පවතින්නේ ඉහළ සිට පහලට රජතුමාගේ අණසකට යටත් වීම මතවූ නමුදු ඇහැලේපොල, පිළිමතලව්වේ, මොල්ලිගොඩ ආදී ප්‍රධාන අධිකාරම් වරුන්ම රජතුමාට විරුද්ධව ඉංග්‍රිසින්ට සහාය දුන්නේය.

1806 දි පමණ සුදු හමුදාවක් නුවර ආක්‍රමනය කරන්නට ගියේ මහ නිලමේ වූ පිළිමතලව්වේගේද රහස් උදව් ඇතිවය. නමුත් ඒ මුලු හමුදාවම එකෙක් නැර සමූළඝාතනය කරන්නට රජු සමත් විය. එවන් අවස්ථාවක ඒ යටත් වූ සුද්දන් ද සමූළඝාතනය කිරීම ඩොයිලි විසින් හෙලා දැක ඇතත් අනුන්ගේ රටක් පැහැර ගන්නට ගිය කිසිම බාහිර සේනාවක් පරාජයේදී උතුම් සැලකිලි ලැබිය නොහැකිය. ඔවුන් අනිවාර්යෙන් ඒ රාජ්‍යයේ හමුදාවෝ අතින් මරණයට පත්වීමේ අවධානම ගනිති. ඒ කන්ඩායමේ නායක වූ කැප්ටන් ඩේවි නැමැත්තා ඝාතනය වූයේ රජුගේ සිර භාරයේදීය. ඩොයිලිගේ දිනපොත් මුල් පරිච්ඡේද වල ඩොයිලිගෙන් නොයෙක් තෑගි ලැබූ අධිකාරමලා දිසාවේලා මේ ඩේවි නම් සුදු නිළධාරියා නිදහස් කර දෙන්නැමැයි කොළඹ සුදු ආන්ඩුවට කියා විශේෂ සත්කාර ලබා ඇත. නමුත් ඩොයිලි ලාට ඩේවි නිදහස් කරගන්නට ලැබී නැත. ඔහු රජුගේ සිර භාරයේදීම මිය පරළොව ගොස් තිබුණි.

පහතරට එවකට වසර සිය ගනනක සිට විදෙස් පාලනයට නතු වූ වටපිටාවක් තිබී ඇත. එවන් පසුබිමක පහතරට පහත් කුලවල ජනයාට තිබූ නිදහස උඩරට විසූ පහත් හෝ ගොවිගම නොවුන කුලවල ජනතාවට නොලැබී යන්නට ඇත. රජතුමාට පක්ෂව තවදුරටත් කටයුතු කිරීමෙන් තමුන් තවත් මේ නරාවලේම මිය යෑ හැකි බවක් මහජනයාට සිතෙන්නට ඇත. ඉංගිරිසි ආන්ඩුව ආ තැන ඇහැලේපොලට රජ කම ගන්න ආශාවක් තිබු අතර ඇහැළේපොල ඒ තනතුරට සුදුස්සෙක් විය. නමුදු ඇහැළේපොල විසින්ද පෙර දිසාවේ තනතුර කල ජනයාට දැඩි පීඩා ගෙනදෙන පාලනයක් ගෙන ගිය නිසාද ඇහැලේපොල පැරණි කුල මල ආදිය දැඩිව සැලකූ අයෙකු නිසාද ඔහුගේ පත්වීමට එරෙහි උඩරට නායකයින් සිටි නිසාද ඇහැලේපොල උඩරට මහ තැනින් විසිවී ගියේය.

ඇහැළේපොලත්, මොල්ලිගොඩ දිසාවෙත්, පිළිමතලව්වේ දිසාවෙත් රජතුමා අසල බොහෝ කලක් සිටි සේවකයින් වූ නමුත් රජතුමාට තිබූ ශටකපට ගති බොහොමයක් ඔවුන් සතුව තිබු බවක් පේන්නට නැත. වඩාත් ජනප්‍රිය කතාවක් වන ඇහැළේපොල කුමාරිහාමි සහ මද්දුම බණ්ඩාර ඝාතනය කිරීම යනු ඇහැළේපොලගේ තිබූ ගොන් කම ප්‍රදර්ශනය කරන අවස්ථාවකි. ඇහැලේපොල සබරගමුව දිසාව ලෙස පත්ව සබරගමුවේදී රජතුමාට එරෙහිව ඉංග්‍රිසින්ගේ උදව් ගෙන රජුට විරුද්ධව සේනා සංවිධානය කරන විට ඇහැලේපොල සිය බිරිඳ සහ දරු තිදෙනා කන්දේ නුවර රජතුමා අසල තබා යෑම අණුවන කමකි. මින් පෙර රජතුමාට එරෙහි වූ පිළිමතලව්වේ මහ නිළමේ මේ වරද නොකොට ඔහු රජතුමාට එරෙහි වන්නට බොහෝ කලකට පෙර සිය පවුල සහ දරුවන් රජතුමා සිටින මානයෙන් ඉවත් කරගත් බව සඳහන්ය.



**තවත් කොටසක් මීළඟ කලාපයෙන්...**

**නීතීඥ ශාන්ත සේනාධීර**
ප්‍රවීන පුවත්පත්කලාවේදී

# "The British Coffee planter who carried his Sri Lankan memories Down Under"

In the early years of 1844, coffee plantations in Sri Lanka (then Ceylon) were thriving. The British had established coffee as a major crop, and the island became one of the world's leading coffee producers. The fertile highlands of Ceylon provided ideal conditions for coffee cultivation, and many British planters invested heavily in the industry.

John George Winchester Wilmot arrived in Colombo, (then the British Crown Colony of Ceylon) in the year 1844. He opened Coffee plantations in Kadugannawa and Kotmale. While engaged in his plantations, Wilmot learned to survey and also worked as a contract surveyor. However, Wilmot's desire for plantations was truncated as the gold rush in New South Wales prompted him to move to Australia in 1852 to seek his fortune in gold. Wilmot, without much success in the gold rush, moved to Melbourne and joined the Surveyor General's department as an assistant surveyor and was entrusted with surveying the telegraph road from Melbourne to Benalla and became the District Surveyor in Benalla in 1854.




My recent holiday with my family was in Mulwala, a small town in the southern part of New South Wales along the Murray River. It is well-known for its beautiful Lake Mulwala, popular among visitors as a water sports and fishing destination. The most phenomenal incident during the holiday was when we found a little town known as "Baddaginnie" along Benalla Road where Wilmot was in charge of surveying the town. The town was named by Wilmot after some Ceylonese workers who worked for him and did not speak English but always they uttered the word "Bada- gini" meaning empty stomach in Sinhalese.*(Wikipedia–Baddaginnie, Victoria)* The town has a primary school, a jubilee hall used by the community for various events, and a Fire Brigade all named after "Baddaginnie"




Wilmot imbued with his memorable planting days in Ceylon, had named another town "Dimboola" in the Shire of Hindmarsh in the Wimmera region of western Victoria, Australia 334 kilometers northwest of Melbourne. The name "Dimboola" is derived from a town in the highlands of Sri Lanka called "Dimbulla" meaning "Land of Figs". The relationship of the name to this area is suggested to have come from the many fruit trees found in the area, many of which were figs. Dimboola is also a popular holiday destination with its Pink Lake where the water turns bubble gum pink during the rainy season. *(Wikipedia – Dimboola, Victoria)*



While surveying for the Victorian government, Wilmot named several places, some of which bore Sinhalese names such as Baddaginnie, Dimboola, and Dookie( from duka, sadness) Wilmot died in the year 1895 at his home in Brighton after suffering from a lung disease. His survey field notes were a rich legacy to the Victorian government and are still being put to good use today. A wave of nostalgia swept over me when I learned about the history of the above towns deriving from Sinhala names. As Sri Lankans, we owe a sense of gratitude to John George Winchester Wilmot for his laudable and exemplary work.



**Ranjith Alwis**
Melbourne, Australia

# HC Bogollagama hosted a reception to honour the SL Cricket Team













High Commissioner of Sri Lanka to the UK Rohitha Bogollagama hosted a special reception at Sri Lanka House in London on 27 August 2024 in honour of the Sri Lanka National Cricket Team, who are currently touring the United Kingdom for a Test match series to take place from 21 August to 10 September 2024. This is Sri Lanka's first Test tour to England since 2016.

The evening was attended by distinguished guests, including members of the UK polity, diplomatic corps, corporate leaders, British and Sri Lankan cricket enthusiasts, and officials, gathered to celebrate the team's visit and to show their unwavering support for Sri Lanka's most beloved sport.

In his address, High Commissioner Bogollagama highlighted Sri Lanka's deep-rooted connection with cricket, tracing its origins back to how the British first introduced the sport to the island in the 1830s. He emphasized how cricket has since evolved into a national passion, becoming part and parcel of Sri Lankan culture. He also spoke of cricket bringing everyone together and thereby becoming a symbol of solidarity The High Commissioner extended his best wishes to the Sri Lanka National Cricket Team for their ongoing tour of England.

Mr. Mahinda Halangoda, the Team Manager of the National Team, also addressed the gathering, expressing his gratitude to High Commissioner Bogollagama for hosting the event. He reflected on Sri Lanka's rich cricketing heritage, underscoring the significance of the sport in the nation's history.

The Sri Lanka National Cricket Team's tour includes three Test matches: from 21 to 25 August at Old Trafford, Manchester; 29 August to 2 September at Lord's, London, and 6 to 10 September at The Oval, London.

The Reception at Sri Lanka House was a reaffirmation of the close ties between Sri Lanka and the United Kingdom, particularly through the shared love of cricket. The event underscored the enduring bond between the two nations, forged through a common sporting heritage and mutual respect.

The Sri Lanka National Cricket Team will continue their tour of England with matches scheduled at the Lord's and at The Oval, and they carry with them the best wishes of the Sri Lankan community both at home and abroad.



# ඉසිවරයකු වූ ගාන්ධර්වයා

## ආචාර්ය පණ්ඩිත් අමරදේව

> ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ, ඩෝල්ටන් අල්විස්, වැනි ප්‍රබුද්ධ ගීත රචකයන් මට ගී පද අමුණා දුනි. එහෙත් මාත් මහගම සේකරත් අතර පැවැති සුසංයෝගය බොහෝ වින්දනාත්මක නිර්මාණ බිහිකරන්නට මාවත සකසා දුන්නේය. සේකරයන්ගේ අභාවයෙන් මා කිසියම් අයුරක අකර්මණ්‍යතාවකට පත්වූවායැයි ඇතැමුන් පවසන දෙය තුළ කිසියම් සත්‍යතාවක් නැතැයි කිව නොහැකිය.



කලාකරුවා ඔහු උගත් ශාස්ත්‍රය තුළින් තුන් කල් දක්නා නිර්මාණ බිහිකරන්නේය. එබඳු කලාකරුවකු එක් මනුෂ්‍යාත්මභාවයකට, එක් කාලයකට, කුලයකට හෝ දහමකට අයත් වූවකු නොවේ. ඔහු පිපී ඇත්තේ ඔහුගේ දේශයේ ඔහුගේම මිනිසුන්ගේ සෝ සුසුම් හා හසරැල් තුළිනි. ඔහුගේ නිර්මාණ තුළින් මේ අනුභූතීන් වහනය වෙයි. මේ හැම දෙයකින්ම ජීවිතය පිළිබඳ විභාවනාව දැඩි කොට පළ කෙරේ. අපේ සිත්සතන් වශී වන්නේ එකී චමත්කාරයෙනි. එබඳු නිර්මාණ රසවිඳින සෑම හදවතක්ම තවත් සුවහසක් හදවත් වෙනුවෙන් වෙනුවෙන් හඬන්නට වරම් ලබයි. ජීවිතය දෙස පිරුණු මනසින් යුතුව බලන්නට හුරු වෙයි.

සියලු කලාවන්ගේ පරම නිර්වාණය ලෙස ගැනෙන සංගීතයෙහි උතුම් හරය නොකෙලෙසා එලෙසින්ම රැක ගන්නට උත්සුක වූ පණ්ඩිත් අමරදේවයන්ගේ තුන් කල් දක්නා ඉසිවර නුවණ ඔහුටම ආවේණික සංගීත දර්ශනයක් ගොඩ නංවන්නට සමත් විය. ශ්‍රී ලාංකේය සංගීතයේ වර්ධනීය අවස්ථාවන් රැසක්ම බිහි කොට එහි නිම්වළලු තව තවත් ඈතට



රැගෙන ගිය අමරදේවයෝ මෙරට සංගීතයේ එක් යුගයක් බවට පත්ව තිබේ.

ආචාර්ය පණ්ඩිත් අමරදේවයන් සමඟ වසර 30ක පමණ කාලයක් ඇසුරු කරන්නට මට වාසනාව හිමිවිය. එතුමා සමග විවිධ තැන්වලට යාමට, එතුමන්ගේ කැසට් සහ සංයුක්ත තැටිවල පිටකවර සැරසීමට හා වෙනත් විවිධ ඡායාරූප ගැනීමට පමණක් නොව එතුමන්ගේ නෑදෑ හිතවතුන්ගේ නිවෙස්වලට එතුමන් සමඟ යන්නට පවා මට අවස්ථා ගණනකදී වාසනාව ලැබිණි. එතුමන් සමඟ විවිධ ගමන් බිමන්වල යෙදෙද්දී තම ජීවිතයේ විවිධ ඉසව් එතුමන් මා සමඟ පවසා තිබේ. මේ වසර කිහිපයකට පෙර එතුමන්ගේ අතීතස්මරණ ඇසුරින් මා විසින් ලියන ලද ලිපියකි.

හුදෙකලා සැඳෑවක චිත්ත වීදියේ මෙහා ඉම සිට මගේ දිවි මගෙහි ගෙවුණු දසක අටක සෞන්දර්ය චාරිකාව දෙස මා නැවත හැරී බලමි. මගේ දෙසවන වැකෙන්නේ මොරටු වැල්ලට නිරතුරුව ගලා එන සර සරණිය වෙරළ සිපගන්නා රාවයයි. කරදිය සුවඳ හා මුසුවුණු ලී කුඩු සුවඳ මගේ නැහැ පුඩු තුළින් ඇතුළුවත්ම සිතට නැගෙනුයේ අපූරු ආස්වාදයකි.

මගේ පියාගේ වඩු මඩුවේදී යත්තෙන් මැදී සුමට ලීයක් බොකු නියනෙන් හැරී, කැපී, සත්සර නංවන අපූරු වයලීනයක් බවට පරිවර්තනය වන සැටි ළමා වියේ මා දෑස් අයා බලා සිටියෙමි. මගේ කුහුල හඳුනාගත් පියාණන් මට වයලීනයක් තෑගි කළේය. විශ්වය පුරා පියඹා යා හැකි අත්තටු යුවලක් ලද්දකු සේ මම මහත් උද්දාමයට පත්වූයෙමි.

ලෝකයත් ජීවිතයත් දෙස උපේක්ෂාවෙන් බලන්නට මා ලද ශික්ෂණය ළමා වියේ අත්දැකීම් හා අති සූක්ෂ්ස්මව බැඳී ඇතැයි මට සිතේ. විශ්වය පුරා විසිර පවතින නාද රටාවෝ සියුම් සංවේදී මනුෂ්‍යයකුට අපූරු කමටහන් බඳුය. මට මුලින්ම සංගීතය කියා දුන්නේ මේ මහා විශ්වයයි. වර්ණාවලියක, මිහිරි පද වැලක, අපූර්ව නර්තනයක, උපරිමයේ ලබන ප්‍රබුද්ධත්වය සංගීතයයි.

මා පියාණන්ද, මෑණියන්ද, මගේ මියැසි කල්පනාවන් අවදි කළ රිවි මඬල හා සඳමඬල වූහ. පියාණන් තිළින කළ වයලීනයත් තුරුළු කර ගත් මා හිරු මඬල සයුරු ළැමට තුරුළු වන සැඳෑවන්හි කොරළවැල්ල වෙරළ තීරයේ පොල් රුප්පාවක් යට සප්ත ස්වරයේ මූලාක්ෂර වැයූ සැටි සිහිවන විට දෙතොලග නිරායාසයෙන්ම සිහින් සිනහ රේඛාවක් ඇඳී යනු මට දැනේ.

මුලින්ම ගවුස් මාස්ටර්ගේ වාද්‍ය වෘන්දයේ වයලීන වාදකයකු ලෙස කටයුතු කරන්නට ලද අවස්ථාව මතකයෙන් බැහැර නොවේ. භාරතයේ වැඩිදුර අධ්‍යාපනය සඳහා මග සැලසුණේ "ලංකාදීප" පුවත්පත ආරම්භ කළ අරමුදල නිසාය. ඒ ඩී. බී ධනපාලයන් හා මහාචාර්ය සරච්චන්ද්‍රයන්ගේ සහය නිසාය. වත්තකුවත්ත වඩුගේ දොන් ඇල්බට් පෙරේරා ලෙසින් උප්පැන්නයේ නම සඳහන් මා භාරතයට යාමට පෙර අමරදේව නමින් බෞතීස්ම කරන ලද්දේ මහාචාර් එදිරිවීර සරච්චන්ද්‍රයන් විසිනි.

පසුකාලීනව ඉන්දියාවේ භාත්කණ්ඩ සරසවියේ දි මුනිවරයන් බඳු ගුරුවරුන්ගේ ඇසුර මට ලැබිණි. ශ්‍රී ක්‍රිෂ්ණ නාරායන්, එස්. එන් රතන්ජංකර්, ගෝවින්ද නාරායන නාතු, විනායක් මුකුන්ද ලෙලේ, කාදම්බරී රංගරාඕ, පණ්ඩිත් විෂ්ණු ගෝවින්ද ජෝග්, දින්කර රාඕ කයිකිනි බඳු පෙරදිග මියැසි මුනිවරු අදත් මගේ බුහුමනට ලක්වන්නාහ.

හත්කණ්ඩ සරසවියේ ප්‍රධානාචාර්යවරයා වූ රතන්ජංකර් පඬිතුමා මට ඉන්දියාවේ නතර වී මා උගත් සංගීතඥාණය එහි සිසුදරුවන්ට බෙදා දෙන මෙන් ඉල්ලා සිටියද මට එය කළ නොහැකි වූයේ මගේ පියාණන්ගේ හදිසි අභාවයත්, මා උගත් දේ මගේ මවු බිමට දායාද කළ යුතුය යනුවෙන් මගේ යටි සිත නිතර හඬා වැටුණු නිසාත්ය.

ලක්බිමට පැමිණි මා වෙත කිසියම් වූ කාර්යභාරයක් පැවරී ඇති බව මට වැටහී ගියේය. සුනිල් සාන්ත ආනන්ද සමරකෝන් විසින් නතර කළ තැන් සිට නැවත ආරම්භ කරන්නට මම සිතාගතිමි. එහෙත් ඔවුන් හින්දි ගීත හා රාගධාරි සංගීතයෙන් බැහැරව ගැමි ගීය ඇසුරේ බොහෝ නිර්මාණ ඉදිරිපත් කළද මහා සයුරක් බඳු සංගීතයේදී එලෙස එක් අන්තයක සිරවී සිටිය නොහැකි බව මට පසක් විය. එහෙයින් මම මගේම ශෛලියක් ඔස්සේ පර්යේෂණාත්මක ගමනක යෙදුණෙමි. ජනගායනා නම් වූ ගුවන්විදුලි වැඩසටහන ඔස්සේ මම මගේ සංගීත චාරිකාව ආරම්භ කළෙමි. මධුවන්ති, විජය ගීත, ස්වර වර්ණ වැනි වැඩසටහන් ඔස්සේ මම සංගීතයේ නව මානයන් සොයා ගියෙමි. වේදිකාව, සිනමාව හා ගුවන්විදුලිය යන විවිධ සයුරු ඔස්සේ මගේ තීර්ථ යාත්‍රාව පාවී ගියේය.

ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ, ඩෝල්ටන් අල්විස්, වැනි ප්‍රබුද්ධ ගීත රචකයන් මට ගී පද අමුණා දුනි. එහෙත් මාත් මහගම සේකරත් අතර පැවැති සුසංයෝගය බොහෝ වින්දනාත්මක නිර්මාණ බිහිකරන්නට මාවත සකසා දුන්නේය. සේකරයන්ගේ අභාවයෙන් මා කිසියම් අයුරක අකර්මණ්‍යතාවකට පත්වූවායැයි ඇතැමුන් පවසන දෙය තුළ කිසියම් සත්‍යතාවක් නැතැයි කිව නොහැකිය. මගේ බොහෝ නිර්මාණවල ගැබ්වී තිබුණේ කම්පනය වන ගේය පද රචනාවන්ය. සේකරයන්ගේ ගී පද තුළ එකී කම්පනය උපරිමයෙන් ගැබ්වී තිබිණි. ඒවා පිවිතුරු විය, තනු නිර්මාණයේදී එම පදවැලේ අරුතට සරිලන අයුරින් අපූරු ස්වරරටාවන් මගේ හෘදයඅභ්‍යන්තරයෙන් ගලා ආවේ නිරායාසයෙනි.

පසු කාලීනව මම බොහෝ නිර්මාණ එළිදැක්වීමි. ඒ සියල්ලම මගේ ආධ්‍යාත්මයෙන් උපන් කම්පනයන්ය. මගේ නිර්මාණ විමුක්තිකාමී ධාවනයෙන් තොර විය. වත්මන් සමාජය ඉල්ලා සිටින අති ධාවනකාරී රැල්ලට ගසාගෙන යන්නට මට නොහැකිය. අති ධාවනකාරී සමාජ රටාව තුළ මිනිසා අපේක්ෂා කරන්නේ ජීවිතයේ ගැටලු වලින් පලායෑමය. සෞන්දර්ය වින්දනය යනු එම ගැටලු වලින් ඈත් වීමය. මගේ නිර්මාණවලට පෙම්බැඳි රසිකයෝ එදා මෙන්ම අද ද මා වැළඳ ගනිති. සංගීතය මට බොහෝ දේ තිළින කළේය.

සුපුරුදු චිත්ත වීදියේ සැරිසරන මට දසක ගණනක් මුළුල්ලේ අත්විඳි සුවහසක් අත්පොළොසන් හඬ රාව ප්‍රතිරාව නංවනු සිහිනයෙන් මෙන් ඇසෙයි. දෙනෙත් පියා මොහොතක් එතුළ ගැලී සිටින මට මනුෂ්‍යාත්මභවය පිළිබඳ යථාව සිහිපත් වන විට ඒ සියල්ල ඇති කරන්නේ දැඩි උපේක්ෂා සහගත හැඟීමකි. සංගීතය යනු මගේ ජීවිතයේම හෙවනැල්ල මිස වෙන කුමක්ද?



සටහන හා ඡායාරූප
ප්‍රවීන ලේඛක
ප්‍රියන්ජන් සුරේෂ් ද සිල්වා

ලංකානිවුස් Lanka News UK
Bringing Sri Lankan news to your doorstep
SEPTEMBER WEB ISSUE 2024
lankanewsuk@yahoo.com

# විභවය, ධාරිතාවය, විඥානය හා ස්වර්ණා



ස්වර්ණා මල්ලවආරච්චි ව මා හඳුන්වන්නේ Tragical නිළියක් ලෙසටය. ඇයට ලංකීය සිනමාව තුල සිදුවූයේ Accidents මය. ඒවා Tragical Accidents ය. ඇය විනෝදාත්මක සිනමාව තුල හැසිරුනේ වරක් හෝ දෙවරක් පමණි. එහෙත් පසුව ඇය රඟපෑ හැම චිත්‍රපටයකම ඇයට සිදුවූයේ, ලිංගික සූරාකෑම්, නො එසේ නම් ලිංගික අසහනාකරී වූ චරිතයන්මය. ලංකාවේ Sex කථා ප්‍රබුද්ධ ලෙස ඉදිරිපත් කරන්නට ලංකීය සිනමාව උපයෝගි කර ගත්තේ ස්වර්ණා වය. ඇත්තෙන්ම එය ඇය වැනි නිළියකට කරන ලද විශාල අසාධාරණයකි.

70 දශකයේදී ඇය ලෙනින් මොරායස් අධ්‍යක්ෂණය කළ 'හොඳම වෙලාව' නම් වූ විනෝදාත්මක චිත්‍රපටයේ සැහැල්ලු, විකට චරිතයක් රඟපෑවේ ක්‍රිස්ටි ලෙනාඩ් ගේ



පෙම්වතියක් ලෙසටය. එම රංගනය ප්‍රේක්ෂකයන් ට ගෙන ආවේ ඉමහත් වින්දනයකි. පසු කලෙක වුවද, ප්‍රේක්ෂකයන් ඇයගෙන් එවැනි සැහැල්ලු, විනෝදාත්මක චරිත රඟපෑමක් බලා පොරොත්තු වූවද, ඉන් පසු ඇයට බොහෝ විට ලැබුණේ Serious චරිත ය. ස්වර්ණා මල්ලවආරච්චි රඟපෑවොත් එය සම්මානනීය චිත්‍රපටයක් වනු ඇතැයි සිතූ චිත්‍රපට අධ්‍යක්ෂක වරු ඇයව එවන් චරිතයන්ට කොටු කරන්නට විය. එයින් සිදුවූයේ ඇයට Versatile නිළියක් වීමට තිබූ අවස්ථාව නැති වීමය.

මා නිතරම ඇයගෙන් දුටුවේ පෝලන්ත නිළියකගෙ ස්වභාවයකි. ඇයගේ පෙණුම හා රඟපෑම බොහෝ විට සම වූයේ 1960 දශකයේ පෝලන්ත නිළියක් ව සිටි 'කලිනා ජෙඩ්රුසික්' ටය. ඇය රඟපෑ 'Eva Wants to Sleep' වැනි චිත්‍රපට වල රංගනයන්, නැවත අපට මතක් කර දුන්නේ ස්වර්ණා මල්ලවආරච්චි වය. ස්වර්ණා ගේ 'හංස විලක්' හී මිරැන්ඩාගේ චරිතය අපට සිහිගැන්වූයේ කලිනා ජෙඩ්රුසික් වය. එයින් මා කිසිසේත් ස්වර්ණා, කලිනාව අනුගමනය කරන බව කියන්නේ නැත. ඇතැම් විට ස්වර්ණා, කලිනාගේ චිත්‍රපට නරඹා නොතිබෙන්නට ඇත. එහෙත් ස්වර්ණා යනු කලිනා ජෙඩ්රුසික් වැන්නන් මෙන් ලෝකෙට යා යුතු නිළියක් බවය එයින් අදහස් වූයේ.

ස්වර්ණා ගේ උපරිම රංගනය උකහා ගැන්මට ලංකාවේ අධයක්ෂක වරයෙක් සිටියේ නැත. 'දඩයම', 'සුද්දිලාගේ කථාව' 'බව දුක' ,'බව කර්ම' 'අනන්ත රාත්‍රිය' වුවද ස්වර්ණාගේ උපරිමය නොව. ස්වර්ණා ගේ රංග විඥානය ට සරිලන අධ්‍යක්ෂක වරයෙක් ලංකාවේ බිහි නොවීම ඇයගේ අවාසනාවය. අශෝක හඳගම 'චන්ද කින්නරි', හා 'ඇගේ ඇස අග' තුලින් ඇයගේ රංගනයේ සාරය යම් මට්ටමකට උකහා ගත්තද, එතන වුවද එය ඇයගේ උපරිමයම නොව, ඇය සිටින්නේ ඊටත් වඩා ගව් ගානක දුරකය. ඇයගේ විභවය එතරම් විශාලය.

ධර්මසිරි බණ්ඩාරනායක ඇයගේ ඒ විභවය හඳුනාගෙන තිබුණද එකී විභවයට සරිලන්නට බණ්ඩාරනායක ගේ අධ්‍යක්ෂණ ධාරිතාව මදි විය. එහෙයින් ස්වර්ණා ට, පහසුවෙන්ම යා හැකි තැනට යාමට නොහැකි විය. ඒ ඇයගේ විභවයට සරිලන ධාරිතාවයන් ලංකාවේ අධ්‍යක්ෂක වරුන් සතු නොවීමය.

මෙරිල් ස්ට්‍රීප් වැනි ඇමරිකානු නිළියට ලැබුණු වාසනාව ස්වර්ණා ට ලැබුණේ නැත. මෙරිල් ස්ට්‍රීප් ඇමරිකානු ඔස්කාර් සම්මාන 21 කට නිර්දේශ වූ නිළියකි. එයින් ඇය 3න් වරක් හොඳම නිළියට හිමි සම්මාන දිනා ගති. ස්වර්ණා ද එසේය. ලංකාව තුල ජනාධිපති සම්මාන, සරසවිය සම්මාන, සහ ඕ.සී.අයි.සී. සම්මාන ගනනාවක් දිනා ගත් නිළියකි. එහෙත් මෙරිල් ස්ට්‍රීප්ට ලැබුණු රංගන අවස්ථා ස්වර්ණා ට ලැබුණේ නැත. ඒ අර අධ්‍යක්ෂක ධාරිතාවයන් ඇයට නොලැබුණු නිසාය. ස්වර්ණා , ඇමරිකානු නිළියක් වූවා නම්, ඇය අනිවාර්යයෙන්ම මෙරිල් ස්ට්‍රීප්ට අභියෝගයක් වෙනවා නිසැකය.

ස්වර්ණා මෑතකදී රඟපෑ 'දඩ ඉම' චිත්‍රපටයෙන්ද එකී අධ්‍යක්ෂක වරයා ස්වර්ණා ව විනාශ කර දැමීය. ඇයගේ රංගන විභවය යම් තාක් දුරට හෝ වසන්ත ඔබේසේකර 'දඩයම' තුලින් උකහා ගත්තද, නියෝමල් පෙරේරා නම් අධ්‍යක්ෂක වරයා 'දඩ ඉම' නම් චිත්‍රපටය තුළින් ස්වර්ණාව 'චප්ප චොරොස්' කර දැම්මේය. 'දඩ ඉම' ප්‍රේක්ෂකයන් ක්ෂණයකින් බැහැර කළේ ඒ නිසාය.

ස්වර්ණා යනු ලාංකීය අධ්‍යක්ෂක වරුන් ඉතාමත් පරිස්සමින් මෙහෙවිය යුතු නිළියකි. මා එයින් අදහස් කළේ ඇයගේ Acting Potential එක එතරම් ම විශාල නිසාය. ලාංකීය අධ්‍යක්ෂක වරුන්ට ඇයගේ රංගන විභවය සමඟ හැප්පෙන්න බැරිය. රංගනයේදී ඇය එතරම්ම දැවැන්තය. හැත්තෑ, අසූව, අනූව දශකයන් තුල සිටි ස්වර්ණා ට වඩා දෙදහස් දශකය තුළ ඇය පරිනත, එමෙන්ම පරිපූර්ණ රංගධාරිනියක් වී ඇත. එකී පරිපූර්ණත්වයට සරිලන 'Directing Capacity' එකක් ලංකාව තුළින් බිහිවී ඇතැයි සිතිය නොහැකිය. නමුත් පුංචි බලාපොරොත්තු වක් නම් ඉතිරිව ඇත. ඒ ඉදිරියේදී තිරගත කිරීමට ඇති මනොරාණි සවරමුත්තු ගේ චරිතය රැගත් අශෝක හඳගම ගේ 'රාණි' චිත්‍රපටය යි. හඳගමට හැකි වේවිද, අහසක් උසට විහිදා ගිය ස්වර්ණාගේ රංග විභවය උකහා ගන්නට?

'සත් සමුදුර' 'හන්තානෙ කථාව' 'අහස් ගව්ව' 'තුංමං හන්දිය' වැනි චිත්‍රපටවල ස්වර්ණා මැවූ කෙසඟ ප්‍රතිරූපය හා කේඩැරි රඟපෑම ඇයගේ දෙවනි ආගමනය වනතෙක් ඇයට වෙනස් කර ගැනීමට නොහැකි විය. ඇයගේ මුල් රංගන කාලයේදී ඇය රඟපා තිබුණේ අයාලයේ ගිය නිළියක් ලෙසටය. එය වඩාත් පැහැදිලි වනුයේ 'මාතර ආච්චි', 'නිම් වළල්ල' 'අපි කවදත් සූරයෝ' (කෙටි චිත්‍රපටයක්) වැනි චිත්‍රපටවල ඇයගේ රඟපෑම් දුටු විටය. ඒ සියල්ලම අයිතිවූයේ 70 දශකයේ එනම් ඇයගේ රඟපෑමේ මුල් කාල වකවානුවටය. එම චිත්‍රපට අතරෙත් ඇය චිත්‍රපට දෙකක එනම් 'සත් සමුදුර' හා 'මාතර ආච්චි' හී ප්‍රධාන භූමිකාවන් රඟපෑවද, ඒවා තුළින් ඇය කැපී නොපෙනුනේ ඒ චිත්‍රපට දෙකම පුරුෂ වාදී චිත්‍රපට වූ නිසාය. ඒවා තුලින් ස්වර්ණා යන 'බ්‍රැන්ඩ්' එකක් ඇයට හදා ගත නොහැකි විය. එම කාල වකවානුවේ 'ස්වර්ණා' යන බ්‍රෑන්ඩ් එක හදා ගත්තේ වෙනත් ස්වර්ණා වකි. ඒ 'බිනරමල' චිත්‍රපටයේ බිනරමලී ලෙස රඟපෑ ස්වර්ණා කහවිටය. සිනමාව




තුළ ස්වර්ණා මල්ලවආරච්චි ට පැවැත්මක් නොමැති නිසා ඇය 'අහස් ගව්වෙන්' පසු රට හැර ගියාය. ඒ හැත්තෑ දශකයේ මැද භාගයේය.

එහෙත් 80 දශකයේ මුල් භාගයේ ඇයව ඇය සිටි බටහිර රටින් නැවත ගෙන ආවේ 'සිංහ බාහු' චිත්‍රපටයේ සුප්‍රාගේ චරිතය රඟපෑමටය. ඒ වන විට ඇයගෙන් අර කෙසඟ, කේඩැරි පෙනුම ඉවත් වී සුරූපි, බටහිර පෙනුමක් දිස්විය. කැලෑ ගත කථාවක් වූ 'සිංහ බාහ' තුලින් ඇයගේ ඒ නව රුව කැපී පෙනුණේ නැත. එලෙසම 'සිංහ බාහ' චිත්‍රපටය ඇයගේ සිනමාවේ දෙවනි ගමනට ආලෝකයක් වූයේ ද, නැත. එයද පුරුෂාධිපත්‍ය මුල් කර ගත් කථාවක් විය. ජෝ අබේවික්‍රම සිංහ බාහු ලෙස මුළු චිත්‍රපටය අයිති කරගත් අතර, ස්වර්ණා ට මතුවන්නට ඉඩ ලැබුණේ නැත. ජෝ ගේ රඟපෑම අසාර්ථක වූ සේම, චිත්‍රපටයද අසාර්ථක විය. 'සිංහබාහු' චිත්‍රපටය තුළින් ස්වර්ණා ට වූ එකම සෙත ස්වර්ණා යළිත් ලංකාවට පැමිණි බව 80ව දශකයේ තරුණ සිනමා අධ්‍යක්ෂක වරුන් දැන ගැනීමය.

පරාක්‍රම සිල්වාගේ 'හෙවනැලි ඇද මිනිස්ස', ධර්මසිරි බණ්ඩාරනායක ගේ 'හංස විලක්' හා ඩී.බී.නිහාල්සිංහ ගේ 'රිදී නිම්නය' චිත්‍රපට වලට ඇයට ආරාධනා ලැබුණේ ඉන් පසුවය. ඒ අතරේදී සරත් රූපසිංහ ගේ 'සංබපාලි', මූ අරුක්ගොඩගේ 'මුවන් පැලැස්ස-2', යසපාලිත නානායක්කාර ගේ 'අංජානා', සේන සමරසිංහගේ 'චංචල රේඛා', ඇන්ටන් ග්‍රෙගරිගේ 'කිරි සුවඳ', පරාක්‍රම සිල්වාගේ 'බිත්ති හතර', සුනිල් ආරියරත්නගේ 'කැලෑ මල', හා සුමිත්‍රා පීරිස් ගේ 'යහළු යෙහෙළි' යන චිත්‍රපටවල රඟපෑමට ඇයට එක දිගට ආරධනා ලැබීය. එහෙත් 'හංස විලක්' හී මිරැන්ඩා ගේ චරිතය හැරෙන්නට ඇයට අනෙක් හැම චිත්‍රපටවලම ලැබුණේ දෙවනි චරිත හෝ සහයක චරිතයන්ය. එහෙයින් ඇය ව කැපී පෙනුනේ නැත.

1983 දී වසන්ත ඔබේසේකර ගේ 'දඩයම' ඇයට යා යුතු නිසි මගට ඔසවා තැබීය. 'දඩයම' ඇයගේ විභවය පෙන්වීමට ලැබූ හොඳ අවස්ථාවක් විය. ඔබේසේකරගේ ධාරිතාව, ස්වර්ණා ගේ විභවයට වඩා අඩුවුවද, ස්වර්ණා, ඔබේසේකරගේ ධාරිතවයටත් වඩා ඉදිරියට ගියාය. නමුත් දඩයමේ රත්මලි යනු ස්වර්ණා ගේ උපරිමය නම් නොවේ. ඒ වසන්ත ඔබේසේකරගේ උපරිමය ය. ස්වර්ණා ට ඔබේසේකර ගේ සීමාවේදී නවතින්නට සිදු වූයේ එය ඔබේසේකරගේ චිත්‍රපටයක් නිසාය. ඉන් පසු ඇයට චිත්‍රපට ගලා එන්නට වූවද, ඒවා බොහොමයක ඇය රඟපෑවේ දෙවනි හෝ තෙවෙනි චරිතයන්ය. සම්භාව්‍ය යැයි නිර්මාණ වූ චිත්‍රපට කීපයකම ඇය රඟපෑවද, ඒ සියල්ලේම තිබුණේ එකම අන්තර් ගතනයන්ය. 'සුද්දිලගෙ කථාව', 'ඩොරින්ගේ සයනය' 'අයෝමා', 'සාගර ජලය මදි හැඬුවා', 'මී හරකා', 'බව දුක', 'කැඩපතක ඡායා' 'බව කර්ම' 'අනන්ත රාත්‍රිය' මේ සියල්ලම එකම 'ෆ්‍රේම්' එකකට අයිති වූ රඟපෑම්ය. ඒ සියල්ලෙන්ම ස්වර්ණා එක කොටුවක තුළ හිරවූ නිසා 'වර්සටයිල්' නිළියක් වීමේ මග ඇහිරුනි. 'අංජනා' චිත්‍රපටයේ ගීතා කුමාරසිංහ සමඟ විජය කුමාරණතුංග ඉදිරියේ 'ඉන්ද කාර යාර් වන්ද' කියමින් ස්වර්ණා නටන විට ඇයට නුහුරු බවක් දැනෙන්නට ඇත්තේ ඒ 'වර්සටයිල්' බව ඇගෙන් ගිලිහූ නිසා විය හැක.

ඒ කෙසේ වෙතත් ස්වර්ණා ගේ විභවයට සරිලන චිත්‍රපටයක් තවම ලැබී නැත. ලාංකීය රංගනයන් තුළින් ඇයට එවැන්නකට අවස්ථාවක් ලැබේවීදැයි සැක සහිතය. ඒ මා මුලින් කීවාක් මෙන් ස්වර්ණා ගේ රංගන විඥානය හා විභවය අධ්‍යක්ෂක වරයාගේ ධාරිතාවයට වඩා වැඩි නිසාය.



**ප්‍රවීන චිත්‍රපට විචාරක, අධ්‍යක්ෂක,**
**ශෝන් මැක්ස්මස් දිසානායක**



# සිංහල භාෂාව යනු...

සිංහල භාෂාව යනු ලෝකයේ එක් කුඩා රටක, කුඩා පිරිසක් පමණක් භාවිත වන අතිශය නොවැදගත් භාෂාවක් බව බොහෝ දෙනා විශ්වාස කරති. ඒ කතාවේ ඇත්ත නැත්ත කුමක්දැයි කරුණු සහිතව විමසා බලමු.

1. ලෝකයේ භාෂා 7000ක් පමණ ඇත. මව්භාෂා ලෙස ඒවා භාවිත කරන ජන සංඛ්‍යාව අනුව මේ භාෂා පෙළ ගැස්වූ විට (චීන, ස්පාඤ්ඤ, ඉංග්‍රීසි, හින්දි, බෙංගාලි ආදී ලෙස) සිංහල භාෂාවට හිමිවන්නේ එහි ඉහළම ස්ථානයක් වන 68 වන ස්ථානයයි.

2. සිංහල භාෂාව මව්භාෂාව ලෙස කතා කරන මිලියන 17ක් පමණ ලෝකයේ ජීවත් වෙති. අනෙකුත් භාෂා කතා කරන ජනගහනය සමග සසඳන කල එය කුඩා අගයක් නොව අතිශයින් විශාල අගයකි.

3. ගූගල් සමාගම පරිවර්තන සේවා සපයා ඇත්තේ ලෝකයේ භාෂා 7000ක් අතරින් ප්‍රමුඛ භාෂා 109කට පමණි. සිංහල භාෂාවද ඒ 109ට ඇතුළත් වේ.

4. සිංහල යනු චීන, හීබෲ, දෙමළ, සංස්කෘත, ග්‍රීක, ලතින්, ඊජිප්තු ආදී වූ ලෝකයේ පැරණිම භාෂාවන් අතරට අයත් වන භාෂාවකි.

5. පැරණි බව පමණක් නොවේ. එය අඛණ්ඩව පරිණාමය වන සජීවී භාෂාවකි. අද වන තුරුත් තමන්ගේ පැවැත්ම ජයග්‍රාහීව තහවුරු කරගෙන සිටින භාෂාවකි. ලෝකයේ ඇතැම් පැරණි භාෂා අද වන විට සපුරා අභාවයට ගොස් තිබුණද සිංහල භාෂාව ඒ ඉරණමට ගොදුරුව නැත.

6. අවුරුදු 2300කට පෙර අපේ මුතුන් මිත්තෝ අපේ භාෂාවෙන් ගද්‍ය රචනා ලිවීමට සමත් වූහ. මේ අගය මීට වඩා ඉහළ බවටද බොහෝ වාද විවාද තිබේ.

7. අවුරුදු 1500කට පෙර සිට අපේ මුතුන් මිත්තෝ අපේ භාෂාවෙන් කවි ලියූ බවට සාක්ෂි බොහෝය. භාෂාවේ සියුම්තම ස්ප්‍රීතුව ලෙස සැලකෙන කවි ලිවිය හැක්කේ ඉතාම දියුණු භාෂාවකින් පමණි.

8. දැනට හමුවන පැරණිම සිංහල කවි වන සීගිරි කුරුටු ගීවල වයස සලකා බැලුවද ඒවා වසර 1300කට වඩා පැරණිය.

9. අනුරාධපුර යුගයේ සිට ආරම්භ වූ දියුණු ගද්‍ය සාහිත්‍යයක් අපට ඇති අතර, ඒ හා සමකාලීනව එවැනි සම්භාව්‍ය සාහිත්‍ය කෘති බිහිකළ භාෂාවක් ලෙස දකුණු ආසියාවේම ඇත්තේ සංස්කෘත භාෂාව පමණි.

10. මනා සංවිධානයක් සහිත තමන්ටම අනන්‍ය වූ දියුණු අක්ෂර මාලාවක් පැවතීමද සිංහල භාෂාවේ විශේෂ ලක්ෂණයකි. නමුත් ඉංග්‍රීසි ඇතුළු ලෝකයේ බොහෝ ප්‍රමුඛ භාෂාවන් රාශියකට තමන්ගේම වූ අක්ෂර මාලාවන් නැත.

11. ඉංග්‍රීසි, ප්‍රංශ, ස්පාඤ්ඤ, ඉතාලි, ජර්මන්, නෝර්වේ ඔස්ට්‍රියා ආදී යුරෝපයේ ප්‍රබල භාෂා 150ක පමණ ප්‍රමාණයක් තම අක්ෂර මාලා ලෙස භාවිත කරනුයේ ලතින් අක්ෂරය. නමුත් ලතින් භාෂාව අද භාවිතයේ නැති තරම්ය.

12. සංස්කෘත, හින්දි, ඇතුළු භාෂා 16ක් පමණ තම අක්ෂර මාලාව ලෙස දේවනාගරී අක්ෂර භාවිත කරයි. නමුත් දේවනාගරී යනු අක්ෂර මාලාවක් මිස යනු භාෂාවක් නොවේ.

13. ඇ, සහ ඈ යන ශබ්ද සඳහා අක්ෂර රූප හෙවත් ඇ කාරය ලෝකයට හඳුන්වා දෙන ලද්දේද සිංහලයන් විසිනි. බොහෝ භාෂාවල ඇ, ඈ ශබ්ද නිරූපණය සඳහා විශේෂිත සංකේත නොමැති අතර, ඇතැම් භාෂාවල ඇ, ඈ යන ශබ්ද පවා ඇතුළත් නොවේ.

14. සිංහල භාෂාවේ ප්‍රකාශන ශක්තිය අතිශයින්ම ඉහළය. සියවස් ගණනාවකට පෙර රචනා වූ සද්ධර්මරත්නාවලිය, ජාතක පොත, ගුත්තිල කාව්‍යය වැනි කෘති දෙස බැලුවද ඒ බව පැහැදිලිව පෙනේ.

15. අක්ෂර සංකේත හරහා විශාල පරාසයක ශබ්ද රාශියක් ඉතා නිවැරදිව නිරූපණය කිරීමේ හැකියාව සිංහල භාෂාව සතුය. නමුත් ඉංග්‍රීසි ඇතුළු බොහෝ භාෂාවල අක්ෂර හා ශබ්ද අතර පැහැදිලි තර්කානුකූල සම්බන්ධයක් දක්නට නැත. මේ අනුව සිංහල යනු ලෝකයේ ඇති භාෂා අතරින් අතිශයින්ම ශබ්දානුගත භාෂාවකි.

16. නිරන්තර පරිණාමයට ලක්වීමද සිංහල භාෂාවේ තවත් සුවිශේෂී ලක්ෂණයකි. කුඩා දරුවන්ට තබන සිංහල නම් දෙස බැලීමෙන් වුවද මේ බව පැහැදිලිව හඳුනාගත හැකිය. ඉංග්‍රීසි බසින් දරුවන්ට තබන නම් වසර සියවස් ගණන් පැරණි ඒවා වුවද සිංහල පුද්ගල නාම දශකයෙන් දශකයට අලුත් වීම සිදුවේ.


17. යටත්විජිතවාදයේ බලපෑම් සහ තර්ජන මැද ලෝකයේ ඇතැම් ස්වදේශික භාෂා මේ වන විට සපුරා අහෝසි වී තිබේ. තුර්කි බස, පිලිපීනයේ ටගලොග්, වියට්නාමයේ චූනෝම්, ඉන්දියාවේ මුන්දා ආදී භාෂා රාශියක් මේ වන විට තම අක්ෂර මාලා වෙනුවට ලතින් අක්ෂර භාවිත කරති. එහෙත් බොහෝ බලපෑම් තර්ජන මැද සිංහලය තවමත් සිය අඛණ්ඩ පැවැත්ම තහවුරු කරගැනීමට සමත් වී තිබේ.

සිංහල යනු ලෝකයේ කුඩා දූපතක අසරණ අනාථ භාෂාවක් යැයි සිතා සිටින ළිංමැඬියන් තමන්ගේ භාෂා උරුමය ගැනත් ලෝකයේ වෙනත් භාෂා ගැනත් මේ කරුණු අවධානයට ගැනීම වැදගත්ය.


**උපුටාගැනීම අතීත මතක හා Twitter - Razzda**

# Babarella
## බාබරෙල්ලා
## රූ ගත කිරීම් ඇරඹේ.
















සරත් කුලාංග සිනමාවේ ප්‍රථම වරට ප්‍රධාන චරිතය රඟපාන ශෝන් මැක්මස්මස් ගේ 'බාබරෙල්ලා' චිත්‍රපටයේ රූ ගත කිරීම් මෙම දිනවල පානදුර, කොළඹ හා ගම්පොල ප්‍රදේශ වල සිදුවේ. නිශාන්ත ප්‍රදීප් ගේ කැමරාකරණය, තනුෂ්ක කහඳවල ගේ සංස්කරණයෙන් ඔප් නැංවෙන 'බාබරෙල්ලා' චිත්‍රපටයේ සංගීත අධ්‍යක්ෂක වරයා සරත් කුලාංගය. කලා අධ්‍යක්ෂණය රොෂාන් රත්නායක සතුවේ

සරත් කුලාංග, දුලානි ප්‍රසංගිකා, හා අනිල් ජයසිංහ ප්‍රධාන චරිත වලට පණ පොවන 'බාබරෙල්ලා' හී සෙසු චරිත රියන්සි ෆ්‍රෙෂර්, ලලිත් පිටවෙල ,රොහාන් ඇන්තනීස්, ප්‍රසාත් මංජුල,රඟපාන අතර, අතිරේක චරිත, සුදේශ් නිමේශ්, ඕෂද ඩි සිල්වා, පීටර් ජෙරම්, රංජිත් කිරිඇල්ල, සමඟ සිරිල් හෙට්ටිආරච්චි රඟපානු ඇත.

'බාබරෙල්ලා' නිශ්චල ඡායාරූප තරංග ප්‍රනාන්දු ගෙනි. ගායනය ,ශෂිකලා වීරසිංහ , දිනිත් බස්නායක හා සරත් කුලාංග ගෙනි. ගීත රචනා, ශෝන් මැක්ස්මස් ,ශාමලින් පෙරේරා, හා රංජිත් කිරිඇල්ලය. බාබරෙල්ලා සම අධ්‍යක්ෂණය සරත් කුලාංගය. කථාව, තිර නාටකය හා අධ්‍යක්ෂණය ශෝන් මැක්ස්මස් දිසානායකය

බාබරෙල්ලා රොමැක්ස් මූවිස් නිශ්පාදනයක් වන අතර, කුමාරි මන්සලා, හා ප්‍රසාත් මංජුල නිශ්පාදනයෙන් සහය වේ.

## Marriage Proposals

A respectable family resided in Gampaha district seeking a suitable partner for their younger daughter born in 1996. Height 5' 2". A MBBS Doctor. Father is a retired Naval Officer and the Mother is also an English Teacher (Retired). Further they have two sons, the elder son is a Bank Officer and the second son working as a Software Engineer. Both are married to a Science Teacher and a Software Engineer respectively.

**Please contact the mother on +94 71 836 7897 (Whatsapp).**

Retired father and mother from Kandy district, seeks a suitable partner with an executive grade job for their daughter, who is academically qualified English teacher born in 1991, height 5" 6". The only brother is an engineer.

**Please contact the mother (Shanthi) on +94 78 569 2230.**

Sister in UK seeks a prospective partner settled in the UK with the ability to sponsor for marriage, for sister living in Sri Lanka, a teacher with a diploma, pretty slim fair 33 years of age, divorcee, no children.

**Please contact Ganga on 07453332989 for further details**

Govi Buddhist, mother seeks a professionally qualified suitable partner for her 39 year old daughter. She is a civil engineer attached to a government ministry in Sri Lanka. She got divorced after 5 months of the marriage.

**For further details contact on Subhashini.seneveratna@gmail.com**

*Send your Marriage Proposals to LNUK: lankanewsuk1@gmail.com*



# ග්‍රේස්ගේ වසර 159ක් පැරණි වාර්තාව කැඩූ කොලු ගැටයා

Ada Derana.lk September 10 2024

පළමු පෙළ ක්‍රිකට් තරගයකදී කඩුලු 10ක් හෝ ඊට වැඩියෙන් දවාගත් ළාබාලම බ්‍රිතාන්‍ය පන්දු යවන්නා ලෙසින් වසර 159ක් පැරණි සුවිශේෂී වාර්තාවක් අලුත් කිරීමට යොවුන් දඟපන්දු යවන ක්‍රීඩක ෆර්හාන් අහමඩ් සමත් විය.

ඔහු මෙම වාර්තාව අලුත් කරනු ලැබුවේ සිය පළමු County තරගයේදී වීමද විශේෂත්වයකි.

එංගලන්තයේ පැවැත්වෙන ප්‍රධානම පළමු පෙළ ක්‍රිකට් තරගාවලිය ලෙසින් සැලකෙන County තරගාවලියේ පළමු කොටසේ 53වැනි තරගය ලෙසින් නොබෝදා අවසන් වූ Surrey කණ්ඩායමට එරෙහි තරගයේදී අහමඩ් මෙම කඩයිම සම්පූර්ණ කළේය.

Nottinghamshire ප්‍රාන්ත කණ්ඩායම නියෝජනය කරන අහමඩ් මෙම තරගයේදී ලකුණු 217කට කඩුලු 10ක් (7/140, 3/77) දවාගැනීමට සමත් විය.

අහමඩ් මෙම කඩයිම පසුකරන විට ඔහුට වයස අවුරුදු 16යි දින 192ක් විය.

ඔහුට පෙර බ්‍රිතාන්‍ය පළමු පෙළ තරගයකදී කඩුලු 10ක් හෝ වැඩි ගණනක් දවාගත් ළාබාලම පන්දු යවන්නා බවට පත්ව සිටියේ ඩබ්. ජී. ග්‍රේස්ය.

ඔහු මීට වසර 159කට පෙර එනම් 1865 වසරේ ඕවල් ක්‍රීඩාංගණයේදී පැවති තරගයකදී ලකුණු 84කට කඩුලු 13ක් දවාගැනීමට සමත් වූ අතර, එම කඩයිම සම්පූර්ණ කරන විට ඔහුට අවුරුදු 16යි දින 340ක් විය.

වත්මන් එංගලන්ත කණ්ඩායමේ නැගී එන දඟ පන්දු යවන්නෙකු වන රෙහාන් අහමඩ්, ෆර්හාන්ගේ වැඩිමහල් සහෝදරයාය.




# ශ්‍රී ලංකාවට සුපිරි පාපන්දු ජයක්

September 11" 2024

ආසියානු පාපන්දු කුසලානයේ සුදුසුකම් ලැබීමේ තරගාවලියේ අවසන් වටයට පිවිසීමට ශ්‍රී ලංකා කණ්ඩායම ඊයේ (10) සමත් විය.

ඒ ආසියානු කුසලාන සුදුසුකම් ලැබීමේ තරගාවලියේ දෙවන වටය යටතේ පැවති තරගයකදී කාම්බෝජය පරාජයට පත්කරමිනි.

ඔවුන් පාපන්දු ශ්‍රේණිගත කිරීම්වල 180 වැනි ස්ථානයේ පසුවෙයි.

ආසියානු කුසලාන පාපන්දු තරගාවලියට සුදුසුකම් ලැබීමේ තරග වටයේ ශ්‍රී ලංකාව සහ කාම්බෝජය අතර දෙවන අදියරේ තරගය ඊයේ පැවැත්වුණේ කාම්බෝජයේදී ය.

ඒ අනුව ජයග්‍රාහී කණ්ඩායම තෝරා ගැනීමට ලබාදුන් අතිරේක කාලයේදී තවත් ගෝලයක් රැස්කළ කාම්බෝජය අවසන් මිනිත්තුව දක්වාම තරගයේ පෙරමුණ ගත්තේය.

කෙසේ වෙතත් තරගයේ අවසන් මිනිත්තුවේදී ශ්‍රී ලංකාව ගෝලයක් රැස්කළේ නැවතත් තරගයේ ගෝල සංඛ්‍යාව සමකරමිනි.

ඒ අනුව ජයග්‍රහකයින් තේරීමට දඬුවම් පහර අවස්ථාව ක්‍රියාත්මක කෙරුණි.

එහිදී කාම්බෝජයේ පළමු දඬුවම් පහර අවස්ථාව ව්‍යර්ථ කිරීමට ශ්‍රී ලංකා ගෝල රකින්නා වන සුජාන් පෙරේරා සමත්වුණේ කාම්බෝජය දෙසට පීඩනය එල්ල කරමිනි.



තරගයේ පළමු අර්ධයේ 37 වැනි මිනිත්තුවේදි ගෝලයක් වාර්තා කළ ශ්‍රී ලංකාව පළමු අර්ධය නිමා වනවිට ගෝල 1ට 0ක් ලෙස පෙරමුණ ගත්තේය.

නමුත් දෙවන අර්ධයේ 51 වැනි මිනිත්තුවේදී ක්‍රියාත්මක වූ කාම්බෝජය ගෝලයක් රැස් කරමින් තරගයේ ගෝල සමකළ අතර තරගයේ නියමිත කාලය අවසන් වනවිට කණ්ඩායම් දෙකම ගෝල එක බැගින් රැස්කරගෙන සිටියේය.

ශ්‍රී ලංකාව සිය මුල් දඬුවම් පහර අවස්ථා 4ම සාර්ථක කර ගැනීමට සමත් වූ අතර කාම්බෝජයට දඬුවම් පහර අවස්ථාවේදි සාර්ථක කර ගත්තේ අවස්ථා 2ක් පමණි.

ඒ අනුව ශ්‍රී ලංකාව 2027 ආසියානු කුසලාන පාපන්දු තරගාවලියේ සුදුසුකම් ලැබිමේ අවසන් වටයට සුදුසුකම් ලබාගත්තේය.

**Ada Derana.lk**



## ඩිල්ශාන්ගේ දියණිය

# ශ්‍රී ලංකා U-19 කණ්ඩායමට

September 12" 2024 06(16 pm

ඔස්ට්‍රේලියාවේදී පැවැත්වෙන වයස අවුරුදු 19න් පහළ කාන්තා තුන්කොන් ක්‍රිකට් තරගාවලියට සහභාගිවන ශ්‍රී ලංකා සංචිතය අද (12) පස්වරුවේ නිවේදනය කළේය.

මොරටුව වේල්ස් කුමරි විදුහලේ මනුදි නානායක්කාරගේ නායකත්වයෙන් යුත් ක්‍රීඩිකාවෙන් 16 දෙනාගේ මෙම සංචිතයට ශ්‍රී ලංකා ක්‍රිකට් හිටපු නායක තිලකරත්න ඩිල්ශාන්ගේ දියණිය වන ලිමන්සා තිලකරත්නද ඇතුළත්ව තිබීම විශේෂත්වයකි.

ඊට අමතරව මෙම සංචිතයට රත්ගම දේවපතිරාජ විදුහලේ ක්‍රීඩිකාවන් 06 දෙනෙකු මෙන්ම ත්‍රිකුණාමලය, අම්පාර, මොණරාගල වැනි කොළඹින් එපිට ප්‍රදේශවලින්ද ක්‍රීඩිකාවන් තෝරාගෙන තිබේ.

මේ අතර තරගාවලිය ඉලක්ක කරගමින් මූලික සංචිතයට මිතාලි අයෝධ්‍යා තෝරාගෙන සිටියද, ඇය ආබාධයකට ලක්වීම හේතුවෙන් එරන්දි හංසමාලි කැඳවා ඇත.

සත්කාරක ඔස්ට්‍රේලියාව සමගින් ශ්‍රී ලංකාව හා නවසීලන්තය අතර පැවැත්වෙන මෙම තුන්කොන් ක්‍රිකට් තරගාවලිය එක්දින මෙන්ම විස්සයි20 ලෙසින්ද පැවැත්වේ.